භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2026 මැයි - ජුනි | 127 වන කාණ්ඩය - 03 කලාපය | පිටු 32 | DOP/MAGAZINE/03/2026



## බලාපොරොත් තැවේ අම්මා

ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# රෑ සඳ අහස් ගඟෙන්

ගී පද - පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමි
සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය - ආචාර්ය නන්දා මාලිනී



**රෑ සඳ අහස් ගඟෙන්**
**ගෙනා සිසිල මහ පොළොවට**
**හිමිදිරියේ පිනි කැට සේ**
**දිලිසෙන විට ළා තණ මත**
**සිහිවෙන්නේ මට අම්මා ම යි**
**අම්මේ හොරෙන් හැඬූ**
**කඳුළු කොයි තරම් //**

**කුලී වැඩ පොළෙන් එතෙරව**
**වෙළී දරු දුකින් දිව යන**
**මැණික් මාළිගාවකි නුඹ සසර සාගරේ**
**සැලී තන කිරෙන් සැතපුව**
**හුදී ජන පහන් කරඬුව**
**කඳුළු මාළිගාවකි නුඹ**
**සසර මාවතේ //**

**බදා හදවතින් දරු දුක**
**නිවා දූ පුතුන් ළය දුක**
**නෙලා ගෙන බැණුම්**
**වී පොරි රැයේ හාමතේ**
**වලාවෙන් මිදී සඳ ලෙස**
**දයාවෙන් වෙළී ගෙට එන**
**කුලී මාළිගාවකි නුඹ**
**සසර ජීවිතේ //**

පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමියන්ගේ හද සසල කරවන පද මාලාවකින් නිර්මිත, නන්දා මාලිනීයන්ගේ මධුර වූ හඬින් ගැයෙන, රෝහණ වීරසිංහයන්ගේ ලයාන්විත තනුවකින් හැඩ ගැන්වූ "රෑ සඳ අහස් ගඟෙන්" ගීතය සියලු අම්මාවරුන්ට පිදෙන ගීතමය උපහාරයක් වැන්න. මෙලොව මිනිස් සංහතිය නොනැසී පවත්නා ප්‍රධාන සාධකය වන්නේ මව් සෙනෙහස බැව් සිය ශ්‍රාවකයාට ඒත්තු ගන්වන්නට රචකයා ගෙන ඇති ප්‍රයත්නය සාර්ථක ය, ප්‍රශස්ත ය.

පිනි කැට, රාත්‍රියේ සිසිල මහ පොළොවට රැගෙන එන්නා සේ, අප ජීවිතවලට සිසිල ගෙන එන්නේ අම්මාගේ කඳුළ ය. අම්මා "හොරෙන් හැඬූ කඳුළු", හිමිදිරි යාමයේ තණ පත් මතට රහසින් වැටෙන පිනි බිඳුවලට සම වන්නේ එබැවිනි. මවගේ ඒ අතීත කඳුළු කතාව, වැඩිහිටි වූ පසුත් දරුවාට අමතක වී නො තිබීම සැබවින් ම භාග්‍යයකි.

අම්මා කෙනෙකුගේ කැප වූ දිවි පෙවෙතට එලෙසින් ම සමාන කළ හැකි යමක් මෙලොව නොමැත. නමුදු, අපූරු උපමා-උපමේයයන් කිහිපයක් යොදා ගනිමින් එම බාධකය ජය ගැන්මට රචකයා වෙර දරයි.

කුලී වැඩ පොළක අපමණ දුක් වින්දත්, ඒ දුක ඈ දරන්නේ සිය දරුවන් වෙනුවෙනි. වටිනා මාණික්‍යයන් ගෙන් හැඩගැන්වූ මාළිගාවකට මිලක් නියම කළ හැකි ද? නො හැකි ය. එලෙසින්, මවකගේ අව්‍යාජ ආදරයත් "මැණික් මාළිගාවක්" නොවන්නේ ද? එයට ද මිලක් නියම කළ නො හැකි ය.

කරඬුවක තැන්පත් කරන්නේ ශුද්ධ වූ දෑ වේ. රචකයාට නම්, මව් සෙනෙහේ ඵලයක් ලෙස ඇගේ නෙතින් ගලා හැලෙන කඳුළ ද, කරඬුවක තැන්පත් කළ යුතු ශුද්ධවූ ධාතු වැන්න. එය වැඳුම් පිදුම් ලැබිය යුතු අගනා වස්තුවකි. ඈ දවස පුරා වෙහෙසෙන්නේ සිය දූ පුතුන්ගේ දුක නිවාලනු පිණිස ය. එනමුදු, අඳුරු වලාවෙන් මිදී ලොව හා දීප්තිමත් ආලෝකයකින් සිනාසෙන සඳ සේ, අම්මා ද, කුලී වැඩ පොළෙන් මිදී හවසට නිවෙසට එන්නේ "දයාවෙන් වෙළී" ය. ඒ නිසා, කුලී වැඩපොළේ දී ඈ හුදෙක් "කුලී කාන්තාවක්" වුවත්, ගීතයේ එනම් මේ දරුවාට නම් තම අම්මා "කුලී මාළිගාව" කි.

මෙනයින් බලන කල "රෑ සඳ අහස් ගඟෙන්" ගීතය යනු උපමා රූපක රැසක් ඇසුරින් මවු සෙනෙහස අරුත් ගැන්වූ අග්‍රගණ්‍යයේ ගීතයකි. මෙවැනි ගීත වත්මනේ නිතර ම සවනට නො වැකීම ජාතියේ අවාසනාව ය.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**

# භක්ති ප්‍රබෝධනය

**2026 මැයි - ජූනි**


ප්‍රකාශනය
නිර්මල මරිය නිකාය

භාරකරු
අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

සංස්කාරක
ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

සංස්කරණ සහය
රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ලහිරු දරණකුඹුර

කවර නිර්මාණය
අචල රූපසිංහ

පරිගණක පිටු සැකසුම
නිලුමිණ හර්ෂාන්

මුද්‍රණය
එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව
3 හෙළිදරව්ව
4 හිමිහිට වන මැදින් - චන්ද්‍රිකා ප්‍රනාන්දු
5 බලාපොරොත්තුව මිනිසා ... - කාමන් සකුන්තලා
6 බලාපොරොත්තුවෙන් ... - බුද්ධික සඳරුවන්
8 අපගේ බලාපොරොත්තුව
ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න
9 අම්මා - මා ජයවීර
10 බලාපොරොත්තුවේ දරුවෝ - වි.ලෙ. පීරිස්
12 ඉකිබිඳ හැඬුවේ ... - ඩබ්. හැරී ලැම්බට් වාස්
13 බලාපොරොත්තුවේ ... - දිලක්ෂි ශිරන්‍යා රුද්‍රිගු
තාත්තේ කීව ම - පස්කල් ජයමාන්න
14 ගරු ඇලෝසියස් පීරිස් පියතුමා ...
ගරු ශානිල් ජයවර්ධන නි.ම.නි. පියතුමා
15 බලා හිඳිමි ... - නීටා අයි. ප්‍රනාන්දු
16 කෙටි කතාව - රමණී ජයන්ති පෙරේරා
18 හිමිදිරි උදයක - ජනිත් ශාමින්ද
19 ජපමාලයේ වැදගත්කම - ලැරින් ප්‍රියානි
යදිනු මැන අම්මේ - සඳුනි වාසනා පීන්තු
20 මේ අහන්න... - රූපස් ප්‍රැන්සිස්
21 ප්‍රසන්න වූ අම්මා - අයිරින් කොස්තා
22 **Mary; The Mother of Hope**
Fr. Rajith Clamantha Edirisinghe
24 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත
25 පුංචි විකුම් - තරු නැන්දා
26 ප්‍රහේලිකා අංක - 91
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා
27 ප්‍රහේලිකා අංක 89 පිළිතුරු හා ජයග්‍රහණ
28 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය II
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය
30 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව යි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළ වන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




## කවරයේ කථාව

ක්‍රිස්තුත්ථානයේ මූලය වී මහත් ඇදහිල්ලෙන් සියල්ල සිත් හි දරා රහසේ ම ගැලවීමේ මග තනන්නට තම මුළු වීර්යයෙන් ම කැප වූ අවසානයේ ශ්‍රී කුරුස සෙවණේ තම පුතුන්ගේ මළ සිරුර දෝත දරන්නට වූ වීර කත වන මරියෝත්තමාවන් හට අප වික්ෂෝප දේව මව් ලෙස ඇමතුව ද, ඇත්තෙන් ම ඇ වික්ෂෝප වූයේ ද? තම කුසින් වදා, තිස්තුන් වසක් ප්‍රේමයෙන් හැදුවේ දෙවියන් වහසේගේ ඒක ජාතක පුත්‍රයාණන් බව නිතැතින් ම දැන කුමකට ඇ වික්ෂෝප වන්න ද? විශ්වාසය මත පදනම් ව දිවි ගෙවූ ඇ නිත්‍යයෙන් ම කුරුස සෙවණේ මුළු ජන සංහතියට ම පිළිබිඹු කළේ ඇ නව බලාපොරොත්තුවේ මව බවත් අප ඇගේ දූ පුතුන් බවත් ය. ඉතින් මෙවර ප්‍රබෝධන ඇරයුම; "වික්ෂෝප වන්නේ කුමකට, දේව පුත්‍රභාවයේ හිමිකරුවකු ලෙස? ලෝකයේ දෘශ්ටියට අනුව ශෝකාන්තයක ගිලුණ ද, ඇදහිල්ලේ නෙත් විවර කර බලනු මැන, ඔබ සිටින්නේ නව බලාපොරොත්තුවේ ද්වාරය අභියස"

**අචල රූපසිංහ**

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 850.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල : bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

**BHAKTHI PRABODHANAYA**

Rs. 850.00 for a year (Including Postage)

Rs. 1700.00 for two years (Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# බලාපොරොත්තුවේ අම්මා

හෙළිදරව්ව



කතෝලික සභාවේ දේව වන්දනා ලිතේ තම පුතණුවන්ට සිද්ධ වූ විවිධ වධගාවිනා නිසා දොම්නසට පත් වන මරියෝත්තමාවන් පෙරදැරි කර ගෙන එතුමිය වෙනුවෙන් වික්ෂෝප දේව මෑණියන් නමින් සැප්තැම්බර් 15 දා අනිවාර්ය අනුස්මරණයක් හඳුන්වා දී ඇත.

ක්‍රිස්තු විරෝධීහු මරණයට ගෙන යන ක්‍රිස්තුන් වහන්සේට සරදම් කළහ. ශාරීරික මෙන් ම මානසික ව ද අප්‍රමාණ වධ හිංසා කළෝ ය. මේ සියලු අවමාන, ප්‍රතික්ෂේප වීම්, පීඩාවන් අබියස දේව මෑණියෝ සන්සුන් ය. කල්පනාකාරී ය. වේදනාබරිත වුවත් එතුමිය අපේක්ෂා භංගත්වයට එහා ගිය බලාපොරොත්තුවක රැඳී සිටියා ය. කිසිවකුට චෝදනා හෝ අවලාද නො කියා මරිය අම්මා කුරුස පාමුල සිටියා ය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය දෙස බලා ගෙන සිටින ආත්මික කැපවීමේ උච්චතම අවස්ථාව ලෙස මරියාවන්ගේ රූපය අපගේ මනසින් වුව ද අපට දැකිය හැකි ය. දෙවියන් වහන්සේගේ කැමැත්තට සහ සැලැස්මට අවනත වූ දිවි පෙවෙතක් එතුමියගේ සමස්ත ජීවිතය පුරා ම දැක ගත හැකි විය.

**"බලන්න, මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස ම මට ඉටුවේවා"** (ලූක් 1:38). දේව මෑණියන්ට දේව සැලැස්ම සම්බන්ධ ඇතැම් කාරණා අවබෝධ නොවී ය. (ලූක් 2:50) **"එය එසේ වුවත් ජේසුස් වහන්සේගේ මෑණියෝ ඒ සියල්ලම සිතෙහි නිදන් කර ගත්හ"** (ලූක් 2:51). කුරුස පාමුල මරිය තුමියගේ වැඩ සිටීම මවකගේ හදවතේ ඇති වඩාත් ම වේදනාකාරී හෝරාවන් ය. තම පුතණුවන් මේ ආකාරයෙන් වේදනාවට මරණයට ඇදී යන අයුරු කිසිදු මවකට ඔරොත්තු නොදෙයි. එහෙත් මරිය තුමිය එකී වේදනාවෙන් පලා නො ගොස් නොපසුබටව පියාණන් වහන්සේ කෙරෙහි තබන ස්ථිරභාවය විසින් එතුමියගේ ආත්මික ශක්තිය සහ දෙවියන් වහන්සේ තුළ තබන ඇදහිල්ල පෙන්නුම් කරයි. ඒ නිසා ම එතුමියගේ මෙම ඉරියව්ව "වික්ෂෝප මෑණියන්" යන ප්‍රතිරූපයට එහා ගිය "බලාපොරොත්තුවේ අම්මා" යන සංකල්පය අපගේ ආධ්‍යාත්මික ජීවිතයට නව පණක් ලබා දෙයි. එනම් බලාපොරොත්තුව යනු කෙතරම් අඳුරු අවස්ථාව තුළ වුව ද ඉදිරියට යන ආලෝකයක් පිළිබඳ විශ්වාසය තබා ගැනීම යි. කුරුස පාමුල සිද්ධිය බලාපොරොත්තු සුන් වූ අවස්ථාවක් ලෙස ප්‍රේක්ෂකයන්ට ඇතැම් විට පෙනුණත් මරිය තුමිය එහි අන්තර්ගත දෙවියන් වහන්සේගේ සැලැස්ම පිළිබඳ විශ්වාසයෙන් සිටියා ය. එතුමිය සුළුවෙන් හෝ අවබෝධ කර ගත්තේ මරණය ක්‍රිස්තු ජීවිතයේ අවසානයක් නොව නව ඇරඹුමකට මග පාදන කවුළුවක් ලෙස ය. ජේසුස් වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයාට සිය මෑණියන් බාර දීම සහ මෑණියන්ට ප්‍රේම කළ ශ්‍රාවකයාව බාර දීම හරහා එතුමිය සියලු ම විශ්වාසිකයන්ගේ "බලාපොරොත්තුවේ මව" බවට පත් වීමේ ආරම්භය කුරුස පාමුල සිදු වූ බව සාන්ත සභාවේ ඉගැන්වීම යි (ජොහන් 19:26-27).

අද දේව මෑණියන්ට ආදරය කරන බොහෝ සැදැහැවත් දූ දරුවෝ තම ජීවිතයේ දුෂ්කර, කර්කශ අවස්ථාවල දී මරිය තුමියගේ ජීවිත ආදර්ශය මතක් කර ගෙන ශක්තිය ලබති. එතුමිය අපට පවසන්නේ බලාපොරොත්තුවෙන් ජීවත්

වීමේ වැදගත්කම යි. කුරුස පාමුල ඇති අඳුර පසුකර නැවත නැඟී සිටීමේ ආලෝකය ඇතැයි විශ්වාස කිරීම යි.

තව ද "බලාපොරොත්තුවේ දේව අම්මා" යන සංකල්පය අපගේ දෛනික ජීවිතයට ද අදාළ කර ගත හැකි ය. හිටි හැටියේ අපට කඩාගෙන වැටෙන කුමන හෝ අභියෝග හමුවේ අභියෝග යට අභියෝගයක් වෙමින්, බලාපොරොත්තුවෙන් සහ විශ්වාසයෙන් නිර්භීතව නැඟී සිටීම ජීවිතය ජයග්‍රහණය කරන්නට ප්‍රදීපාගාරයකි. ඒ සඳහා මරියෝත්තමාවන්ගේ ජීවිත ආදර්ශය තුළින් අපට ලැබෙන පන්නරය අසීමිත ය.

කුරුස පාමුල "බලාපොරොත්තුවේ අම්මා" යන තේමාව කිතුනු ජීවිතයේ ප්‍රධාන අංශයකි. එලෙස ඇති කර ගත්තා වූ ආධ්‍යාත්මික ආකල්පය නිසා දුක තුළින් බලාපොරොත්තුව, අඳුර තුළින් ආලෝකය සහ මරණය තුළින් ජීවිතය දකින්නට ඇදහිල්ලේ දෙනෙත් අප තුළ නිර්මාණය වේ. එවිට මරිය මෑණියන්ව ප්‍රතිමාවකට අපි කොටු නො කරමු. මල්වලින් සරසා පොරි විසි කරමින්, රතිඤ්ඤා හඬින් පෙරහැර දෙවනත් කරමින් කන්බීරි කරන දේව මෑණියන්ගේ ප්‍රතිරූපය මහ පාරේ සහ වීදි ඔස්සේ වැඩමවා ගෙන යන සුරුවමකට සීමා නො කරමු.

ඒ වෙනුවට දේව අම්මාගේ සෙනෙහස, කැපවීම, වැයවීම නිවැරදිව අපගේ ජීවිත පැවැත්මට එකතු කරගෙන විශ්වාසයෙන් සහ බලාපොරොත්තුවෙන් දෙවියන් වහන්සේගේ හඬට සුසර වෙමින් කිතුනු අනුගාමික ජීවිතය ජීවත් කරන්නට මහත් පරිශ්‍රමයක් දරමු. බැරි අමාරුකම්, අසරණකම්, පාපිෂ්ඨකම්, අහංකාරකම්, ආත්මාර්ථකම්වලින් හිත පිරෙන විට දේව මෑණියන්ගේ සෙනෙහස, මග පෙන්වීම, දේව ප්‍රඥාව ලබන්නට අපි වාසනාවන්තයෝ වෙමු. එතුමිය අපගේ මග සලකුණ වේ. වැලපෙන්නට නොව ගැලවෙන්නට කුරුස පාමුලට දිව යමින් බලාපොරොත්තුවේ දේව අම්මා අබියස දැහැන් ගත වෙමු. මා විසින් පද රචනා කරන ලද පහත ගීතිකාව ආචාර්ය රෝහණ වීරසිංහයන් තනු නිර්මාණය කළ අතර එය ගායනා කරන්නේ ටෙරෙන්සියා දල්පතාදු දියණිය යි.

"බෙලි මලක් සේ දිව ඔසුවක් වූ
සුදු නෙළුමක් සේ පිවිතුරු වූ
මට නා රුකක් මෙන් සිසිල ගෙනා
දේව මෑණියනේ නිමල මරිය අම්මේ

දෙව් වදන් සිතේ දරා ගෙන මහ සයුර වූ
ඇදහිලි මගේ නොනිමෙන පහන් ටැඹ වූ
සරල දිවියේ සෞම්‍ය ආලෝකේ
ඔබය ඇදහිලි සංසයේ අම්මා අපේ

දෙව් වදනට සිත සුසර කරගත් මරියනි
නිහතමානී දේව දාසිය වූ මරියනි
කුරුස පාමුල බලාපොරොත්තුවේ අම්මා
දේව මෑණියනේ නිමල මරිය අම්මේ"

**("ස්වර්ගය කරා" ගීතිකා පොත, පිටු අංක 31)**

**සංස්කාරක පියතුමා**

## හෙම්හිට වන මැදින්

හෙම්හිට වන මැදින් සිපා
ගලනා යුරු හුදෙකලාව ඔබ
විඳ අප සැනසුණේ
නිසල ව ගලන ඔබ දැක
ශෝක නැහැ වුණේ දිනෙක
සිය දහස් දෙනෙත් අප
සිය දහස් වාරයක්
කිති කැවෙන දිය බිංදු
සිරි සිරි හඬින් විත්
සිප ගත්තේ එකින් එක විහිද
තෙමා ගත සිත සිසිල් ව
දිය පොදක් වී හිරි වැටෙන
කිම ද ඔබ මෙලෙස
රුදුරු දිය දහරක්ව කෝපව
සිය දහස් නෙතු වසා
ශාපේ කිම රැගෙන ගිය
ඉඩ නොදී හෙළන්නට කඳුළක්
ඔවුනගේ දෙනෙතින්... !

**චන්ද්‍රිකා ප්‍රනාන්දු**

# බලාපොරොත්තුව මිනිසා ජීවත් කරවයි ද?

කිතුනුවා බලාපොරොත්තු සහගතව ජීවත් වන නිදහස් මිනිසෙකි. ඔවුන්ගේ බලාපොරොත්තුව රැඳී ඇත්තේ මිනිසුන්ට ඇති දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමය මත ය. විවිධ අභියෝග හා ප්‍රශ්න ගැටළුවලට මුහුණ දීමට මිනිසාට සිදු වේ. එහි දී විශ්වාසය හා බලාපොරොත්තුවේ ස්ථිරව සිටින්නට බිය සැක අඳුර දුරු කර මමත්වය අත හැර දේව ප්‍රේමයට ප්‍රති ප්‍රේමය ප්‍රකාශ කළ යුතු වේ.

අප සැම දෙනාගේ ම එක ම සිහිනය දිගු කල් ජීවත් වීම යි. ජීවිතයේ නව බලාපොරොත්තු වැඩි කිරීමට අද සමාජයට ඉවහල් ව ඇත්තේ විද්‍යාව හා තාක්ෂණය යි. බලාපොරොත්තු බිඳ වැටී ඇති අප දේශයේ නව බලාපොරොත්තුවක් උදෙසා දේශයට යහපත් වැඩදායී සමාජයක් ගොඩ නැඟීම යි. දේශපාලන වශයෙන් බෙදුණු සමාජ නොසන්සුන්තාවක ගමන් කරන අප පවතින ආර්ථික අර්බුද සමඟ නව මාවතකට ගමන් කළ යුතු වේ. රට වැසියන් ලෙස සැම දෙනා ම යුක්තිය, සහෝදරත්වය, නිහතමානී, සංවේදී බලාපොරොත්තුවේ සමාජයක් ගොඩ නැඟීම සැමගේ වගකීම වේ.

මනුෂ්‍යයන් ලෙස විවිධාකාරයේ තරාතිරම් සහ විවිධ වයස් පරතරවල සිටින අප හට ඇති බලාපොරොත්තු විවිධාකාර වේ. වත්මන් සමාජයේ දක්නට ලැබෙන තරගකාරී ස්වභාවය හමුවේ ඇති නැති භේදය මුල් කර ගෙන මෙම බලාපොරොත්තු අප තුළ ජනිත වේ. කිතුනුවන් ලෙස අප තුළ තිබිය යුතු බලාපොරොත්තුව විය යුත්තේ ස්වර්ග රාජ්‍යය අත්පත් කර ගැනීම යි. දිනෙන් දින අපගේ බලාපොරොත්තු ද අලුත් වේ. අපගේ මනස ද බලාපොරොත්තු උපදවන උල්පතක් වැනි ය. වර්තමාන සමාජයේ එක් එක් වයස් මට්ටම්වලට ආවේණික වූ බලාපොරොත්තු දැකිය හැකි ය.

අපගේ ජීවිත වේගයෙන් විනාශය කරා ගමන් කරයි. පාපය ලොව රජ කරවමින් වටිනා ජීවිත බිලි ගනියි. නපුර දිනෙන් දින උසස් වෙමින් ජීවිතවලට පීඩා කරයි. බලාපොරොත්තු නොවූ රෝගවලින් ජීවිත අහිමි වෙයි. මේ සියල්ල නිසා අපගේ ජීවිතවල වටිනාකම අඩු වෙමින් සියල්ල වියවුල් වී අසමාදානයෙන් ජීවත් වීමට සිදු වේ. අපගේ බලාපොරොත්තු අසාර්ථක වී තිබේ. මිනිසා මිනිසා තුළ ම අසරණ වී සිටියි. මෙවැනි ලොවක ජීවත්වන ජනතාව පාපයෙන් ද, රෝගයෙන් ද, නපුරෙන් ද ගලවා සදාකල් ජීවනය උරුමකර දීමට ක්‍රිස්තුන් වහන්සේ මෙලොව ඉපදී කුරුසයක මරණයට පත් වී නැවත මළවුන්ගෙන් නැඟිට වදාළ සේක. මේ ලෝකයේ සියලු දුක් පීඩා මධ්‍යයේ ප්‍රීතියෙන්, සතුටින් හා සමාදානයෙන් ජීවත් වීමේ ආශීර්වාදය අප සතුව තිබේ. මෙය මිනිසාට මිහිපිට ලැබිය හැකි ඉතා උතුම් වූ ආශීර්වාදයකි.

කතෝලික අපව කැඳවා ඇත්තේ සාමයේ දරුවන් වන්නට ය. අන්‍යෝන්‍ය ගරුත්වය හා අවබෝධය පදනම් වූ සම්බන්ධතා ගොඩ නඟන්නට සහ බෙදුණු අය අතර පාලමක් වන්නට සැම කෙනෙකුට ම අභිමානයෙන් හා බලාපොරොත්තුවෙන් යුතුව ජීවත් විය හැකි නව සමාජයක් ගොඩ නැඟිය යුතු වේ. දයාවේ සහ යුක්තියේ සමාජයක් තුළින් පොදු යහපත මූලික කර ගනිමින් සහෝදරත්වයේ සහ සහජීවනය වැළඳ ගනිමින් අභියෝගවලට මුහුණ දීමේ දී බලාපොරොත්තු සුන් කර නො ගෙන, බලාපොරොත්තු විරහිත අවස්ථාවේ අපට නිරතුරු පිහිට වන දෙවිඳුන්ට කන්නලව් කරමු. උන් වහන්සේව විශ්වාස කිරීමට අප කැමති වූ පමණින් අපගේ සියලු ප්‍රශ්න ක්ෂණයකින් නො විසඳෙන්නේ ය. දෙව් මහෝත්තමයාණන් නිරතුරු අප සමඟ සිටින තාක් අපට බලාපොරොත්තු තබා ගත හැකි ය. අපගේ ඉතා අසීරු අවස්ථාවල දී පවා ජේසුස් වහන්සේ අප සමඟ ය. අපව කිසිදා අත් නො හරින බව දැන ගෙන එක ම බලාපොරොත්තුවකින් සැමට ජීවත් විය හැකි ය.

කාමන් සකුන්තලා

# බලාපොරොත්තුවෙන් ඉන්න - ස්වර්ගයට යන්න අපටත් එන්න - අතකුත් දෙන්න - බලාපොරොත්තුවේ අම්මේ...



මහ පොළොවේ මිනිසුන් ලෙස, අප සැම හීන දකිනවා සේ ම ඒ සිහින සැබෑ කර ගැනීමට වෙර දරන පුද්ගල කොට්ඨාසයක් ලෙස පෙන්වා දිය හැකි ය. එම හීනවලට පණ පොවන විට දුක මෙන් ම සතුට ද සම සිත්ව දැරීමට සිදුවන බව නම් සත්‍යයකි. අපගේ ජීවිත කඩයිම් පිළිබඳ අභිලාෂයන් මල්ඵල ගැන්වෙන තුරු බලා සිටිනුයේ, බලාපොරොත්තු රැසක් පොදි බැඳ ගෙන ය. අප සියල්ල ධනාත්මකව සිතා අනාගතයට සූදානම් වුව ද, යම් හෙයකින් ඍණාත්මක බලපෑමක් අපගේ සිහිනවලට එල්ල වුවහොත් එය දරා ගැනීමට අපට ශක්තියක් තිබේ ද? මෙය අප සැම පෞද්ගලිකව සිතා බැලිය යුතු කරුණක් නොවේ ද? කිතුනුවන් ලෙස අපගේ අවසාන පැතුම ස්වර්ගය ම වේ. එම අවසාන නවාතැන තුළ ඔබගේ මගේ ඉඩකඩ වෙන් කර ගැනීමට සිදු වනුයේ මෙලොව දී ම ය. සත්‍ය වශයෙන් ම එය අපට කළ හැක්කක් ද?

'බලාපොරොත්තුවට' අප ඉංග්‍රීසි භාෂාවේ භාවිතා කරනුයේ 'HOPE' ලෙස ය. මා එය මෙලෙස විග්‍රහ කිරීමට කැමැත්තෙමි.

- H - HOLD
- O - ON
- P - PAIN
- E - END

කිතුනු අපගේ ජීවිතයේ, විවිධ අරගල හමුවේ, අප අසරණ වන අවස්ථා බහුල ය. නමුත්, ඒ සැමට පිළිතුරක් ද අනිවාර්යයෙන් ම ඇත. අසරණකම තුළ, ඇබ්බැහිකම තුළ, අප සොයා ගන්නා පිළිතුර අවසානයේ අපව ස්වර්ගයට එසැවෙනවා ද? නිරයට පහත් වෙනවා ද? යන්න තීරණය වේ. ක්‍රිස්තු අනුගාමිකයන් ලෙස, අපගේ එක ම සිහිනය ස්වර්ගීය සම්පත්තිය විඳීම නම්, එයට තුඩු දෙන යහපත් මගක් අප විසින් ම සොයා ගත යුතු නොවේ ද? "එපමණක් නොව, පීඩා විඳීමෙන් ඉවසිල්ල ද, ඉවසිල්ලෙන් තැන්පත් බව ද, තැන්පත් බවෙන් බලාපොරොත්තුව ද උපදින බව දැන අප විඳින පීඩාවල දී වුව ද, අපි ප්‍රීති ප්‍රමෝද වෙමු. එබඳු බලාපොරොත්තුවකින් කිසි ම කලකිරීමක් ඇති නොවේ. මන් ද, අපට දෙන ලද ශුද්ධාත්මයාණෝ දේව ප්‍රේමයෙන් අපේ සිත් පුරවන සේක" (රෝම 5:3-5). ප්‍රශ්න හමුවේ අසරණ වන සැමට දේව වචනය නව පණක් ලබා දෙමින් පවසන්නේ, අපේ අසරණ බව දේව ආදරය තුළ සතුටක් බවට හැරවෙන බව ම ය. අප සැමගේ ජීවිතවලට වඩා කිට්ටු චරිතයක් ලෙස දේව මෑණියන්ව ගත් විට, එතුමියගේ ජීවිතයේ අසරණ වූ අවස්ථා බහුල ය. ගාබ්‍රියෙල් දේව දූතයා විසින් කිතු උපතේ පණිවිඩය මරිය වහන්සේට දැන්වීමේ දී, ඇයගේ සිහින අමු අමුවේ බිඳ දැමෙන්නට ඇත; එය නිසැක ය.

- ජුසේට දුන් පොරොන්දුව දෙවිඳු අභියස අවලංගු කළ ඇය,
- ජුදා නීතිය නො තකා දේව නීතියට හිස නැමූ ඇය,
- ඊළඟ තත්පරය පිළිබඳව නො සිතා මේ තත්පරයේ දේව හඬට හිස නැමූ ඇය,

අද ස්වර්ගයේ රාජිනිය ලෙස කිරුළ දරනුයේ, පීඩාව තුළ ඉවසීම ප්‍රගුණ කර, ඉවසීම තුළ තැන්පත් බව ප්‍රගුණ කර දේව සැලැස්මට එහෙයි කියූ නිසා නොවේ ද? අපගේ ගමනාන්තයත් ස්වර්ගය නම්,

මරිය වහන්සේ මෙන්, දේව හඬට කීකරු විය යුතු නොවේ ද?

- මෙලොව ආදරය සිඟනවා වෙනුවට දේව ආදරයේ පහස ලබමු.
- පීඩාව තුළ දෙවිඳුන් අත් නොහරිමින් විශ්වාසයෙන් රැඳෙමු.
- මිනිස් සිතැඟියාවන්ට නොව දේව හඬට අවනත වීමට පොරොන්දු වෙමින්, පතමු මරි මව් සරණය, යන්නට ස්වර්ගය වෙතට ම.

"දෙමාපියෝ උන් වහන්සේ දුටු කළ මවිත වූහ. උන් වහන්සේගේ මෑණියෝ, 'පුතා කුමක් නිසා අපට මෙසේ කළෙහි ද? බලන්න ඔබේ පියා ද මම ද, දුකින් තැවි තැවී ඔබ සෙවීමු' යි කීය. එවිට උන් වහන්සේ පිළිතුරු දෙමින් ඔබ මා සෙව්වේ මන් ද? මා පියාණන්ගේ මැඳුරෙහි සිටිය යුතු බව ඔබ නො දන්නාහු දැ යි වදාළ සේක (ලූක් 2:48-49).

දරුවා සහ මව අතර ඇති අවියෝජනීය බැඳීම ඉතා ප්‍රබල ය. වසරක් පාසා ජෙරුසලමට විත් සමරන පාස්කු මංගල්‍යයේ දී, උන් වහන්සේ පඬිවරුන්ව ද මවිත කරමින් ප්‍රශ්න අසමින් සිටි සේක. තමන්ගේ සිහින සියල්ල බිඳ දමමින් දේව අණට හිස නැමූ ඇයට ලැබුණු ස්වර්ගීය තිළිණය මේ වන විට ඇයගෙන් මඟ හැරී ඇත. නමුත් ඇය දින තුනක් නොකඩවා මුළු ජෙරුසලම පුරා තම පුතණුවන්ව සෙවූයේ දැඩි බලාපොරොත්තුවකිනි. අවසානයේ තම පුතණුවන්ව මුණ ගැසුණේ ද, දේව මාළිගාව තුළ දී ම ය. දේව මාළිගාව යනු දෙවියන් වහන්සේ ජීවමානව වැඩ සිටින ස්ථානය වේ. නැති වූ දේව පුත්‍රයාව ද මරිය වහන්සේට හමු වනුයේ එය තුළ දී ම ය. ප්‍රශ්න හමුවේ අසරණව, විවිධ දේවලින් පිළිතුරු සොයා වර්තමාන සමාජයට දේව මාතාවන් නිවැරදි පිළිතුර තිබෙන ස්ථානය පහදා නො දෙන්නේ ද?

- ප්‍රතික්ෂේපිත ආදරයේ ආදරණීය වැලඳ ගැනීම සුදු පූපය ම යි.
- උත්තර නොමැති ප්‍රශ්න සඳහා පිළිතුර තොණ්ඩුව නොව ජපමාලය යි.

ජපමාලය සහ සුදු පූපය අපගේ ජීවිතවලට සම්බන්ධ කර ගත් විට, ස්වර්ගීය සම්පත්තිය නිසැක ය. දේව මාතාවන් වහන්සේ මේ සියල්ල සිත්හි නිදන් කර ගනිමින්, ස්වර්ගය දෙස මෙන් ම දේව සැලැස්ම දෙස බලාපොරොත්තුවෙන් නෙත් අයා සිටියා ය. අපගේ අවසාන නැවතුම වන ස්වර්ගීය නවාතැනට උරුමය ලබනු පිණිස, ජපමාලය හුරු කරමු අතට. ලබමු සැමදා ජේසුව සුදු පූපය ලෙසින්. එවිට අප ද උන් වහන්සේගේ ස්වර්ගීය භෝජනයේ හවුල්කරුවෙකු වන බවට නොරහසකි.

බෙත්ලෙහෙමේ සිට කපාල පිටිය දක්වා ගමනට තම පුතුට ශක්තිය වුණේ දේව අම්මා ම යි. මගේ ජීවිතයේත්, කපාල පිටිය තරණය කරන්න එක ම ශක්තිය දේව අම්මා ම යි.

- කානා නුවර සිට කපාල පිටියේ සොල්දාදුවාට පෙනීම ලැබෙන තුරු පසුපස සිටියේ දේව අම්මා ම යි. මගේ ජීවිතයෙත් සිදු වන සෑම ප්‍රාතිහාර්යයට ම මැදිහත්කාරිය එතුමිය ම යි.
- ගල් කණුවේ බැඳ පිටට තලද්දී, ඒ සෑම කස පහරක් ම තම හදවතට දරා ගත්තේ දේව අම්මා ම යි. මගේ ජීවිතයෙත් පැරෙන හදවතට දිව්‍යමය ඔසුව ඔබ තුමිය යි.
- තමන්ගේ පුතාව සොරකු වාගේ පාරේ ඇදගෙන යන විට, දේව කැමැත්තට ඉඩ දුන්නේ දේව අම්මා යි. මගේ ජීවිතයෙත් වැටෙනා හැම තැනක දී ඔසවන්නේත් එතුමිය ම යි.
- ජේසු පුතාට වගේ ම අප සැමට ම මේ අම්මා ආදරේ දෙද්දී ස්වර්ගය නො ලැබී යයි ද? දේව අම්මත් සමඟ බලාපොරොත්තුවෙන් සිටිමු. ස්වර්ගීය උරුමය හිමි කර ගනිමු.

**බුද්ධික සඳරුවන්**
**සා. අන්තෝනි දේවස්ථානය,**
**දළුපත.**

# අපගේ බලාපොරොත්තුව

අපගේ මරිය මෑණියන්ගේ මව සහ පියා වන ආනා ජුවකීම් යුවල වයස් ගත වීත්, දරුවකු නැති සොවින්, මහත් වූ වික්ෂෝපයකින් කල් ගෙවූහ. නමුත් ඔවුහු දරුවකු පතා කරන යැදුම් පුද පූජා නො නවත්වා ම කළෝ ය. ඔවුහු වයස්ගත වූවත් දෙවියන් වහන්සේ කෙරෙහි වන බලාපොරොත්තුව අත්හැර නො දමා විශ්වාසයෙන් සිටියෝ ය.

දරුවකු නොමැති කම නිසා සමාජයෙන් ලැබෙන අපවාද, ප්‍රතික්ෂේප කිරීම් දරාගෙන බලාපොරොත්තුවේ පහන සිත් තුළ දල්වාගෙන සිටියෝ ය. මේ බලාපොරොත්තුව මල් ඵල ගන්වා දේව අනුහසින් ආනා මවු කුසයෙහි දරුවකු පිළිසිඳුණි. මේ බලාපොරොත්තුවේ දරුවා අපගේ මරිය අම්මා ය.

දේව මාළිගයට කැප කළ මරිය කුමරිය එහි දී බයිබලයේ පුරාණ ගිවිසුම, දේව ධර්මය, නීතිය වැනි විෂය කරුණු මනා ලෙස හැදෑරුවා ය. උත්පත්ති පොතේ සඳහන් වන ගැලවුම්කරුවකු එවීමට දෙවියන් වහන්සේගේ පොරොන්දුව මරිය කුමරිය මෙන් ම අනෙක් දරු දැරියන් ද අධ්‍යන්‍යය කරන්නට ඇත. එසේ ම වඩින්නට සිටින ගැලවුම්කරුවාණන්ගේ මව ජුදා වංශයෙන් තෝරා ගන්නා බව ද එකල ජනතාව දැනගෙන සිටියෝ ය.

ජුදා තරුණියෝ බොහෝ දෙනෙක් ගැලවුම්කරුවාණන්ගේ මව වීමේ ආශාවෙන්, බලාපොරොත්තුවෙන් ජීවත් වූහ. එසේ ම ඒ ගැන යාච්ඤා කරන්නට ද ඇති. නමුත් මේ බලාපොරොත්තුව මල් ඵල දැරුවේ මරිය කුමරියගෙන් ය. ගැලවුම්කරුවාණන්ගේ පැමිණීම පැරණි ගිවිසුමේ යෙසායා දිවැසිවරයාණන් පැහැදිලි ලෙස ම දක්වා ඇත. ඒ කරුණු කාරණා සියල්ල ම මරිය කුමරිය ඇතුළු සැම දරුවකු ම ඉගෙන ගන්නට ඇත.

"බලන්න කන්‍යාවක් පිළිසිඳ ගෙන පුත්‍රයකු බිහි කරන්නී ය. එම්මානුවෙල් යන නම ඔහුට තබන්නී ය" (යෙසායා 7:14).

"අපට දරුවෙක් උපන්නේ ය. අපට පුත්‍රයකු දෙන ලද්දේ ය" (යෙසායා 9:6).

"දාවිත්ගේ රජ පෙළපත නමැති වෘක්ෂයෙන් රාජාංකුරයක් හට ගන්නේ ය. එහි මුල්වලින් අලුත් පැළයක් නැඟී එන්නේ ය" (යෙසායා 11:1).

"එම්බා බෙත්ලෙහෙමේ එප්‍රාතා! තී ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප වන්නී ය. එහෙත් ඉශ්රායෙල් කෙරෙහි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැඟී එන්නේ ය" (මීකා 5:2).

මෙලෙස පුරාණ දිවැසිවරුන් විසින් ඉශ්රායෙල් කෙරෙන් අධිපතියකු පැමිණෙන බව ප්‍රකාශ කර ඇත. මේ සියලුම වාක්‍ය ග්‍රන්ථ අධ්‍යයනය කර බොහෝ තරුණියන් මහත් ආශාවෙන් බලාපොරොත්තුවෙන් බලා සිටින්නට ඇත. නමුත් බලාපොරොත්තුවේ ආශ්චර්යය උදා වූයේ මේ අපගේ මරිය කුමරියට යි.

"මක්නිසාද දෙවියන් වහන්සේට නො කළ හැකි කිසිවක් නැත" (ලූක් 1:37).

වයස්ගත වූ, වඳ යැයි සැලකූ එළිසබෙත් හට දරුවකු පිළිසිඳ ගෙන ඇත. පුරුෂයකු නාඳුනන තරුණියක් ද ගැබ් ගෙන ඇත. දහසක් දෙනාගේ බලාපොරොත්තු අතරින් මරිය තුමියගේ බලාපොරොත්තුව ඉෂ්ට විය. එලෙස ම අපිත් අපගේ සැම බලාපොරොත්තුවක් ම දේව මව තුළින් එතුමියගේ පුත්‍රයාට භාර කරමු.

ජේසු තුමා කානා නුවර විවාහ මංගල්‍යයේ දී වතුර මිදිරස බවට පත් කළේ ද තම මව වන මරිය මෑණියන්ගේ ඉල්ලීමට යි. එතුමියගේ ඉල්ලීමක් කිසි ම විටෙක ජේසු තුමා ඉෂ්ට නොකර නො සිටින සේක. ජේසුස් වහන්සේ කුස දරා අපමණ දුක් කම්කටොළු මැද බිහි කර, අනේක අතුරු ආන්තරාවලින් තම දරුවා රැකගෙන උස් මහත් කළේ මේ අම්මා ය.

මවකට දැරිය නො හැකි දුක් උසුලමින් තම පුතුගේ අවසාන මොහොත දක්වා අප්‍රමාණ ශෝකයකින් පුතු පසු පස ගියේ ද මේ අම්මා ය. ජේසු සමිඳුන් කුරුස ගසේ සිට 'සකල ලෝකයේ ම දයාබර මව' ලෙස අපව භාර දුන්නේ ද මේ අම්මාට ය. තම පුතු අවසන් හුස්ම හෙළන අයුරු බලා සිටියේ ද මේ අම්මා ය.

මෙම කරුණු කාරණා සියල්ල ගැන ගැඹුරින් විශ්ලේෂණය කර බලා "සකල ක්‍රිස්තියානීන්ගේ දයාබර මවු තුමිය" ලෙස II වන වතිකානු මන්ත්‍රණ සභාවේ දී, ශුද්ධ වූ 6 වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා විසින් දේව මාතාවන් වහන්සේව හඳුන්වා දෙන ලදී. ඒ හැඳින්වීම මතින් අප සැම දෙනාගේ ම " දයාබර අම්මා" බවට එතුමිය පත් වූ සේක. ශුද්ධ වූ අල්පෝන්සු ලිගෝරි තුමා මරිය මෑණියන්ව හැඳින්වූයේ අපගේ "ගැලවීමේ දොරටුව" යන නාමයෙනි. එහි අර්ථය වනුයේ අපගේ ප්‍රාර්ථනාව, අපගේ බලාපොරොත්තුව වන ගැලවීම ලබා ගැනීමට ඇතුළු විය යුත්තේ මරිය මෑණියන්ගේ හදවත නමැති දොරටුව තුළින් බව යි. එතුමියගේ හදවත් දොරටුව නිරතුරුව ම අප වෙනුවෙන් විවෘතව පවතී. එතුමිය කරා යාම පමණි අප කළ යුතු වන්නේ පුතෙකු ළඟට යාමට ඇති හොඳ ම මාර්ගය පුතුගේ අම්මාගේ හදවතට ළං වීම යි. අම්මාට ආයාචනා කිරීම යි. එවිට අනිවාර්යයෙන් ම පුතු ළඟට ඇය අපව ගෙන යනු ඇත. ඒ බව ශුද්ධ වූ බොනවැන්තුර් තුමා අපට මෙලෙස කියා දෙයි.

"ජේසු සමිඳුන් හමුවීමට යා යුතු දොරටුව මරිය අම්මා ය". අපි එතුමිය මඟින් ජේසු සමිඳුන් හමු වීමට බලාපොරොත්තු වෙමු. එලෙස අපගේ බලාපොරොත්තුව මරිය අම්මා හමු වීම යි. යම් දිනක එතුමිය අභියසට යාම යි. එතුමිය සමඟ ජේසු තුමන් හමු වීමට යාම යි. ඒ සඳහා අපි අපගේ සිත් සූදානම් කර ගනිමු.

**ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න**

# අම්මා...

මේ මහ පොළව මත උතුරා ගලා යන
පිවිතුරු අමර ආදරයේ සුවඳ ගුණ
දැසින් දකින දෙකනින් ඇසි ලොකු ම පින
අම්මා ඔබය දිවි දුන් දෙන එක ම පණ

දරමින් සියලු බර දරුවන් හැඩ ගැස්සූ
දුක් ගිනි මැදට ඔබ ම ය සිසිලස වැස්සූ
එන රුදු අවිදු මත නුවණින් පසු බැස්සූ
පෙර පෙර කඳුළු ලොව යහපත උඩ ඉස්සූ

ඇති හැකි දිනට ළඟ සිටිනා මිතුරු කැල
නැති ගුණ පවා ගයමින් දෙති ළබැඳි මල
අසරණ වෙලා මහ මඟ පිය නගන කල
අම්මා පමණි අත දෙන රන් රුවන් වැල

මල්බර උයන්වල සමනලයින් සමඟ
සිටියා නැළැවී නැළැවී විඳ මුදු සුළඟ
කාලය ගෙවී සුන් වෙනදා ගති විහඟ
අම්මේ ඔබේ සෙවණයි සැනසුම සුමඟ

රුපුසෙන් වටලමින් මා තනි කළ දවසේ
කටින් වීරකම් පෑ උන් හොර රහසේ
පැන යන දිනේ ඔබ දුන් කිරිවල බොහෝ සේ
රැදි මහ උතුම් විරුගති ළඟට ම පිවිසේ

මා වට දැල්වෙමින් තිබු නෙක පහන් රැස
මිලිනව අඳුරු බර පාළුව රැහැයි ගොස
නො දැනිම නැඟෙන දින මා සිටි සතර දෙස
"ඉර හඳ" වුණා අම්මේ ඔබෙ සොඳුරු ඇස

හිමි යස ඉසුරු පොහොසත්කම් අහිමි දින
පෙර නෑ හිතවතුන් කොහෙ දැ යි සොයා යන
දිනක දි ඔවුන් මා දැක බොහො දුරින් එන
ගේ දොර වසයි අම්මා එයි කිරුළ ගෙන

ජේසුස් වටා සිටි සැම දෙන පලා යන
අවසන් පැයේ දෙව් මව් පෙරමුණට පැන
පෑ ඒ පරම උත්තම ගුණ රඳන තැන
අම්මා අමරණීය යි ලොව අමිල මිණ

**මා. ජයවීර - පිටිපන**

# බලාපොරොත්තුවේ අරුණෝ



බිඳ නො ගෙන, ජීවිතය පවත්වා ගෙන යෑමට දෙවිඳුන් අපට දී ඇති ආධ්‍යාත්මික ගුණධර්මය බලාපොරොත්තුව ය. මානව විද්‍යාඥයන් අවධාරණය කරන්නේ, බලාපොරොත්තුව අප තුළ වාසය කරන බව ය. අපේ ආගමික සම්ප්‍රදායයේ දිවැසිවරුන් ද පෙනී සිටියේ බලාපොරොත්තුව නො නසා පවත්වාගෙන යෑමට ය. නොසැලෙන විශ්වාසයකින් දිවැසිවරු ප්‍රකාශ කළේ යම් දිනක දෙවිඳාණන් මැදිහත් වී සියල්ල ම යළි එහි මුල් යහපතට පවත්වා, සියල්ල ම පූර්ණත්වයට පත් කරවන ස්වාමින් වහන්සේ පැමිණෙන බව ය (ජොවෙල් 3:11-15). දිවැසිවරු සහ ඉශ්‍රායෙල් ජනතාව බලාපොරොත්තු වූයේ සියල්ල යළි පූර්ණත්වයට පමුණුවාලන ගැලවුම්කාර සමිඳුන්ගේ ආගමනය යි. මේ ජනතා බලාපොරොත්තුව, යථාර්ථයක් බවට පත් කරලීමට දෙවිඳාණන් තමන්ගේ මධ්‍යස්ථකාරිය ලෙස තෝරා ගත්තේ, නාසරෙත්හි විසූ කන්‍යාවක් වූ මරියාවන් ව ය. දේව ආරාධනාවට කීකරු වූ මරිය තුමිය, තම කුළුඳුල් පුතාව බිහි කර "ජේසුස්" යන නම තැබුවා ය. එදා සිට මරිය අම්මා, දිවැසිවරු සහ ජනතාව බලාපොරොත්තු වූ ගැලවුම්කරුවාණන්ගේ අම්මා වූ අතර "බලාපොරොත්තුවේ අම්මා" වූවා ය.

## බලාපොරොත්තුවේ ගීතය

මරියාණන්ගේ උදාන ගීය (ලූක් 1:46-55), බල අධිකාරීන් විසින් පීඩාවට පත් කරනු ලබන සාගින්නෙන් පෙළෙන අසරණයන්ට බලාපොරොත්තුව උදා කරන ගීතයකි. එමෙන් ම අධිපති දේශපාලනයේ ඉතිහාසය වෙනස් කරමින්, ජනතා බලය රජ කරවන දේශපාලනික විමුක්ති ගීයකි. මේ උදාන ගීය, කොතරම් පීඩාකාරී දරදඬු පාලනයක් ඉදිරියෙ පවා අප සමඟ සිටින දෙවිඳාණන් කෙරෙහි බලාපොරොත්තුව වර්ධනය කරන උත්ප්‍රේරක ගීයකි. මරිය අම්මාගෙ උදාන ගීය කිතුනු සමාජීය, දේශපාලනික ක්‍රියාධරයන්ගේ මැදිහත්කාරිය ලෙස, ඔවුන් දිරි ගන්වන අම්මා බලාපොරොත්තුවේ අම්මා ය. මෙහි දී මට සිහි ගැන්වෙන්නේ, පිලිපීනයේ ඒකාධිපති වියරුවෙන් පෙළුන මාකොස්ගෙ මර්දනකාරී යුද සෙබළුන් මැද්දේ, ජන අරගලයේ නිරත තරුණ, තරුණියන් මරිය මවුගේ ප්‍රතිමාව රැගෙන පෙරහැරේ යමින්, සොල්දාදුවන්ට මල් පොකුරු පිළිගන්වමින් යන විට, සොල්දාදුවන් තම අවි බිම තබා මල් පොකුරු පිළිගත් අයුරු ප්‍රාතිහාර්යයේ චමත්කාරය බලාපොරොත්තුවේ චමත්කාරය යි. දෙවන ලෝක යුද සමයේ දී අපේ රට බෝම්බ තර්ජනයෙන් මුදවාලීමට, එවකට කොළඹ අගරදගුරු මැසොන් හිමිපාණන් දේව මාතාවන්ට දෙව් මැඳුරක් (බැසිලිකාවක්) තැනීමට බාර හාර වීමේ ප්‍රතිඵලයක් ලෙස අද අපට තේවත්තේ "ලංකා අප ස්වාමි දුවගේ" නමින් කැප කරැති බැසිලිකාව ඇත. එලෙස ම කතෝලික අප කොතරම් දුරට මරිය අම්මා, බලාපොරොත්තුවේ අම්මා ලෙස ගෞරව පූර්වකව යදින්නේ ද යන්න, අපේ රටට පැමිණිය හැකි සෑම දුර්භාග්‍යයක දී ම අප යදින, "අපේ රටට සාමය පතා දේව මෑණියන්ට යාච්ඤාව" සාක්ෂි දරයි.

## ආදරණීය මාතෘ සෙනෙහස

අපරිමිත මාතෘක සෙනෙහසේ අත්දැකීමක් දේව ධර්මධර ලෙනාඩ් බොෆ් (Leonard Boff) පියතුමා මෙසේ දක්වයි. කලක සිට මා දන්නා හඳුනන කාන්තාවක් මා කැඳවා අභිරහස්මය හඬකින් "පියතුමෙනි, එන්න". අපි කාමරයකට පිවිසුනෙමු. ඇඳේ සිටියෙ ඇගෙ පුතා ය. ඔහුව පෙනෙනුයේ "අද්භූතයෙකු" ලෙස ය. ඔහුට

තිබුණේ වැඩිහිටියෙකුගෙ මෙන් විශාල හිසකි, ඔහුගෙ සිරුර කුඩා දරුවකුගෙ මෙන් ය. ඔහුගේ ඇස් සීලීම වෙත රවා ගෙන ය. ඔහුගෙ දිව පිටතට, ඇතුළට දමමින් සිටියි. දරුවාගේ අම්මා මා අමතමින්, "මේ දරුවාව මේ වන විට අවුරුදු 8ක් මෙලෙස රැක බලාගෙන ඇත. ඔහු දන්නේ මාව පමණයි. මම ඔහුට දැඩිව ආදරෙයි". කිසිවකු මේ වග දන්නේ නැත කියමින්, පියාණෙනි මා අහස දෙසට ඔසවා මරිය තුමිය මෙන් "පියාණෙනි, ඔබේ කැමැත්ත සිදු වේවා" යි යදිමින් නැවතුණා ය. මේ අම්මාගෙ බලාපොරොත්තුවේ අධ්‍යාත්මයේ ප්‍රභවය මරිය අම්මාගේ අධ්‍යාත්මිකත්වය යි. අම්මා කෙනකුගෙ ආදරණීය සෙනෙහස කොතරම් ද? එයටත් වඩා අපේ මරිය අම්මා අප කොතරම් අධ්‍යාත්මිකව විකෘති වුවත්, අපව අත් නොහරින අපේ බලාපොරොත්තුවේ අම්මා ය.

**<u>අපි බලාපොරොත්තුවේ දරුවෝ වෙමු!</u>**

දරුවන්ගේ ආදරය ප්‍රථමයෙන් ම අත් විඳින්නෙ අම්මාගෙනි. එනිසා ම ජීවිතයේ සෑම සුබ - අසුබ අවස්ථාවක දී ම අප බලාපොරොත්තු වන්නේ අම්මාගේ මැදිහත්වීම ය. එලෙස ම, එතුමියගේ දරුවන් ලෙස එතුමිය මෙන් අපේ අසල්වැසියාට අපි බලාපොරොත්තුව මැදිහත්කරුවන් විය යුතු ය. මෙලෙස අපි බලාපොරොත්තුවේ අම්මාගේ බලාපොරොත්තුවේ දරුවෝ වෙමු.

**<u>සාක්ෂි දැරීමක්</u>**

ක්‍රියාකාරී මරිය හමුදා මූලිකයකු මරිය අම්මා කෙරෙහි දක්වන බලාපොරොත්තුව සාධනීය අත්දැකීමක් මා සමඟ බෙදා ගන්නේ මෙසේ ය. "දැඩි මානසික අසහනයෙන් පෙළෙන, දඩබ්බරව හැසිරෙන, අසල්වැසි ප්‍රජාවට කරදරයක් බවට පත් වී ඇති තම මවගෙන් ද දුරස්ථ වූ අවුරුදු හතළිස් දෙකක් පමණ වයසැති මංමුළා වූ කාන්තාවක් පිළිබඳව, මරිය හමුදා අපේ සාමාජිකාවක් අපව දැනුවත් කළා ය. මනෝවිද්‍යාත්මක උපදේශනය සහ හිතමිතුරුකරණය (Be Friending) පිළිබඳ අත්දැකීමක් සහිත මා, සාමාජිකාවන් දෙදෙනකු සමඟ ඇයව හමුවීමට ගියේ යමක් කළ හැකි ය යන අදහසෙන් ය. නිරීක්ෂණය කරමින් ඇය සමඟ කතාබහ කළ පසු, මා තුළ පැවැති බලාපොරොත්තුව සිඳී, බිඳී යන තරමට දුර්වල විය.

යැදුම්ගතව මෙනෙහි කිරීමේ දී, මරිය හමුදා අත් පොතේ සඳහන් කර ඇති අපට කළ හැකි කාර්යයන් අතර, මංමුළා වූ, අත්හරින ලද ආත්මයන් ගැලවීමේ කාර්යය කෙරෙහි මගේ සිත ඇදී ගිය අතර බලාපොරොත්තු රහිත අවස්ථාවක දී බලාපොරොත්තුව තැබිය හැකි, බලාපොරොත්තුවේ අම්මා වන මරිය අම්මා කෙරෙහි දැඩි ලෙස බලාපොරොත්තුව තබමින් වින්දිත කාන්තාව මුදවා ගැනීමේ අභියෝගය බාර ගත්තේ අන් අයගේ අධෛර්ය කිරීම් මැද්දේ ය. මරිය භක්තිකයකු ලෙස බලාපොරොත්තුව අවියක් කර ගත් මා මංමුළා වූ ආත්මය සුවපත් කිරීමේ මෙහෙවරේ යෙදුණෙමි. මා කළේ ඇයට සවන් දීම ය. ඒ සඳහා මා යොදා ගත්තේ දූරකථනය යි. ඇයට අවශ්‍ය ඕනෑ ම මොහොතක මට ඇමැතීමට නිදහස තිබිණ. කිසි විටෙක ආර්ථික උපකාර කිරීමට ඉදිරිපත් නොවූ අතර, ඇය තුළ තමා කෙරෙහි විශ්වාසයක් ඇති කර ගනිමින්, තමන් වටිනා අයෙකු බව පිළිගැනීමට සහය වූයෙමි. මේ වන විට වසර එක හමාරක් පමණ ගත වී ඇති අතර ඇය දැන් ගත කරන්නේ අලුත් ජීවිතයක් කලින් මෙන් තම කුසගිනි නිවා ගැනීමට කාමාතුරයන්ගෙ ගොදුරක් බවට පත් වන්නේ නැත. සුහද සබඳතා ගොඩනඟා ගැනීමත් සමඟ ඇයව හොඳින් පිළිගෙන, ආහාර සපයන පවුල් කීපයක් ද ඇත. ඇය මා සමඟ මෙසේ පැවැසුවා ය.

"අයාලේ ගිය කාලකණ්ණි ජීවිතය ඉවරයි! මම දන්නවා මා කවුද කියා. බෞද්ධයෙකු වන මම දැන් සිල් සමාදන් වෙනවා. කතෝලික අය මට හරි කරුණාවන්ත යි".

මරිය හමුදා ක්‍රියාකාරී මූලිකයා අවසානයේ දී පැවැසුවේ මෙය යි. "බලාපොරොත්තු රහිත මේ අවිනිශ්චිත අවස්ථාවේ දී බලාපොරොත්තුවේ මරිය අම්මා කෙරෙහි තබන ලද බලාපොරොත්තුව ඉටු වීමේ භාග්‍යය මම අත් වින්දෙමි".

**වි.ලෙ. පීරිස්**
**උස්වැටකෙයියාව.**

# ඉකිබිඳ හැඬුවේ හැකිමුත් අම්මේ කුරුසියෙ මඟ මවකට ඇති උරුමේ.

2026 මාර්තු - අප්‍රේල් භක්ති ප්‍රබෝධනය සඟරාව අතට ගෙන ලිපි කිහිපයක් කියවීමෙන් අනතුරුව ඊළඟ සඟරාවේ තේමාව දෙසට නෙත් යොමු කළෙමි. "බලාපොරොත්තුවේ අම්මා", මා හට ලිපියක් ලියන්නට බලාපොරොත්තුවක් ගෙන දුන්නේ ය ය. දස මසක් කුස තුළ දරා සිටිමින් සියල් අයුරින් දෙවිඳු මහිමයෙන් මා පොහොණි කර එතරම් උගත් කමක් නො ලද එහෙත් පුහුණුවක් ලබා සිටි ගමේ ඥාති වින්නඹු අම්මා කෙනෙකුගේ ආධාරයෙන් එදා නීරෝගීව නිවස තුළ දී ම මා මෙලොවට බිහි කළ බලාපොරොත්තුවේ දයාබර අම්මා මට සිහිපත් විය. ඇය මෙලොවින් සමුගෙන මේ වන විට වසර ගණනාවක් ගෙවී ගොස් ඇතත්, ඇගේ ගුණ දම් සුවඳ මගේ නාස්පුඩු තුළින් ආත්මීය හදවතට ඇතුළු වී එය කලඹනු දැනිණි. ඇය බිහි කළ දරුවන් අතරින් සියල්ලන්ට ම වඩා ඇය සමඟ කිට්ටු සම්බන්ධතාවක් දැක්වූ දරුවා වූයේ මා යයි මම විශ්වාස කරමි. පුංචි අවධියේ සිට විවාහ දිවියට ඇතුළු වන තුරු මා ඉතා සමීපව ඇසුරු කළ එදිනෙදා ජීවිතයේ අත්දුටු සියලු මිහිරි අමිහිරි අත්දැකීම් දුක සැප සතුට විවෘතව බෙදාගත් මා සැනසූ මා නැළවූ මා දිරිමත් කළ ශාරීරිකව මානසිකව ආධ්‍යාත්මිකව මා සංවර්ධනය කරමින් නිසි මඟ පෙන්වූ විශ්වාසවන්ත ම තැනැත්තිය ඕ වූවා ය.

ලියන්නට කියවන්නට තරමේ උගත්කමක් ලබා තිබූ දහමට ළැදි දුප්පත් දෙමාපිය යුවලකගේ එකම දියණිය ලෙස ක්‍රි.ව. 1918 දී මෙලොව එළිය දුටු ඇය ගමේ රෝ.ක. පාසලෙන් අකුරු කළා ය. එවකට ප්‍රාරම්භ විභාගයට පෙනීසිටි ඇයට එක් විෂයක් අසමත් වීමේ හේතුවෙන් දෙවන වර එයට පෙනී සිටීමට සිදු වී ඇත. යහපත් සහකාරියක වීම සඳහා විභාග සමත් වීම මෙන් ම රැකියාවක් කිරීම අනවශ්‍ය යැයි සිතූ දෙමාපියන් ඇයට ඊට ඉඩහළේ නැත. තව ද විභාග මධ්‍යස්ථානය සැතපුම් 15ක් පමණ දුරින් පිහිටා තිබූ නිසාත් තවත් වසරක කාලයක් අධ්‍යාපනය සඳහා මිඩංගු කිරීම වැඩදායක යයි නො සිතූ නිසාත් ඇගේ බලාපොරොත්තුව එතෙකින් සමාප්ත විය. ගුරු වෘත්තියට එළඹීම සඳහා පැවති කඩඉම් විභාග යට මුහුණ දීමේ අවස්ථාව මඟහැරීම නිසා මවගේ සිතෙහි පැළපදියම් වී තිබුණේ දැඩි කනස්සල්ලකි. ජීවතුන් අතර සිටි වැඩිමහල් දරුවා වශයෙන් එම දුක්මුසු අත්දැකීම මා හා සමඟ බෙදාගත්තේ අධ්‍යාපනයේ හා පිළිගත් වෘත්තියක ඇති වටිනාකම මා හට අවබෝධ කර දීමේ දූරදර්ශී අරමුණින් යයි දැන් මට වැටහේ.

පසු කාලීනව පවුල තුළ ආර්ථික බර වැඩිවීමත් සමඟ ස්ථිර ආදායමක් සහිත ගුරු වෘත්තියේ නියැලීමේ වටිනාකම හා භාග්‍යය ඇයට වැඩි වැඩියෙන් දැනෙන්නට ඇත. ආර්ථික ගැටළු මතු වන විට සාමකාමී පවුලක් තුළ වුව ද සමගියට බාධා පැමිණිය හැකි බව ඇය මා හට පෙන්වා දුන්නේ අත්දැකීම් ලත් පවුල් උපදේශිකාවක් මෙනි. තමා රැකියාවක නියැලී සිටියේ නම් පවුලේ ආර්ථික බර ඉසිලීම සඳහා සැමියා හට සවිමත් අත්වැලක් සැපයීමට තමාට හැකිවනු ඇත යන්න ඇගේ සිතේ තිබූ උතුම් බලාපොරොත්තුවක් විය.

පවුල තුළ යහපත් අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ඇය තුළ පැවති අධිෂ්ඨානය හා ක්‍රියා කලාපය පියා අභිභවා ගිය අයුරු සමහර අවස්ථාවල දී අපට දැක ගත හැකි විය. කුඩා අවධියේ පටන් දේව ගරු බිය ඇතිව හැදුණු වැඩුණු අම්මාගේ බලාපොරොත්තු රඳා පැවතුණේ සිය දරුදැරියන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා පමණක් නොවේ ය යන්න කලකට පසුව මම තේරුම් ගතිමි. නාඹර තරුණ වියේ දී ම අකල් මරණයකට ගොදුරු වී ජීවිතයට සමු දුන් තම මිණිබිරියගේ කුසින් බිහිවූ මී මුණුබුරාගේ අනාගත වැඩිදියුණුව පතා ඇ මා හා කළ සාකච්ඡාව මහා සාගරයක් බඳුවූ ඇයගේ අනාගත බලාපොරොත්තු සමුදාය මොනවට ප්‍රකට කළ එක් අවස්ථාවක්

විය. වසර 98ක් ආයු වළඳා අවසන් සුසුම් හෙලන්නට සූදානම් වන අවධියේ දී ඈ තුළින් දිස්වූ දේව භක්තිය මෙන්ම ග්‍රාමයේ නාම සාන්තුවරයාණන් කෙරෙහි තිබූ භක්තිය සදාතන ජීවිතය පිළිබඳ ඇය තුළ පැවති මතු බලාපොරොත්තුව මැනවින් සාක්ෂාත් කළා ය.

**ඩබ්. හැරී ලැම්බට් වාස්**
**වෙන්නප්පුව.**

# බලාපොරොත්තුවේ අම්මා

දෙමාපියන් හට කීකරු වී
විසූ යහපත් ගුණවත් දියණී
ගලීල නාසරෙත් නුවර
ආනා ජුවකීනු යුවලට දාව ව

දෙවිඳුන් සැලැස්ම අනුව යමින්
දෙවිඳුන් කැමැත්ත ඉටු කරමින්
යටහත් පහත් ව කීකරු වී
ලෝ ගැලවුම්කරු ජනිත කළේ

නිහඬ බවයි දෙවිඳුන් යැදුම යි
නිරතුරු බලාපොරොත්තුවක් වූයේ
පුතුගේ මෙහෙවර දියත් කරන්නට
ශක්තිමත් ආයුදය වුණේ

කල්වාරි ඉම නගින විට දී
දෙවිඳු පුතුට සවිය වුණේ
අපගේ කුරුස ගමනේ දීත්
නිරතුරු අප හට සවිය වුණේ

දෙවි පුත් සවිමත් කර
බලාපොරොත්තු දුන්
ලෝ ගැලවුම පෙන්වා දුන්
නුඹයි බලාපොරොත්තුවේ අම්මා

**දිලක්ෂි ශිරනායා රුදිගු**
**11 ශ්‍රේණිය,**
**ශා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07.**

# තාත්තේ කීවම...

අපේ ගමේ පොලීසියට ගියවිට කලකට පසු
එහි සිටි දූවරු දැකීම දසුනක් විය රසමුසු
ගිය සැණින් ම පිළිගෙන මා ඇයි දැයි විට දී ඇසූ
අගෙයි කියා සිතුණි එය වලට වඩා රංමසු

පොලිස් වාර්තාවක් ගන්නටයි ගියේ එහි මෙමා
එන්න තාත්තේ යනුවෙන් කියමින් දෙනුවන් යොමා
කරමින් සිටි වැඩේ කරන්නේ නොමැතිව මෙන් නිමා
කැඳවා ගෙන ගියා කාමරය වෙත නොමැතිව පමා

මගේ ඇඟිලි සලකුණු එක් මග තෙක් ගන්නා විට
රැඳී ළඟ ම නො ගිහින් මා එතැන දමා ඉවතට
තද කරන්න එපා රිදෙයි කී වම ඒ මහතට
වචන නොමැත හදේ මැවුණු සොම්නස පැවසීමට

හැත්තෑ නම වසරක් මම ගොස් ඇතිමුත් දස දෙස
මෙවැනි දරු පැටව් මෙමට අංකල් කීවා මිස
තාත්තා ය කීව කෙනෙක් සිටියේ නැත මෙලෙස
මෙතකැ යි කීමට නොහැකි ය මෙහි දී මැවුණු තොස


තාත්තලා නො දෙන දෙයක් නැත තම දරුවන් වෙත
මේ දූවරුනට කිසිවක් දෙන්නට අවසර නැත
මොනව හිතාවි දැ යි නො දනිමි ගැටුණොත් එය නෙත
පුද කළෙමි තුතිය මගේ පිරුණු මුළු හදවත

තාත්තියෝ මේ තේ එක කියාගෙන හෙමිහිට
හැමදාමත් උදැසන ම පැමිණෙන කාමරයට
මගේ දුව වගේම කළ ආදරය මා හට
දූවරු එනවා හමු වූ පොලීසියෙ දි මතකෙට

ඉල්ලුවෙමි දූවෙක් මෙමම වෙතින් මගේ දෙවිදුව
ඇය දුන් දුව ළඟ ම හිඳිමි මම අද වෙනතක නොව
දස වසකට පෙර දවසක ගිය ඇය ද හැර ලොව
ඇගේ තාත්තා මම යැයි මතකයි පැවසූ බව

**පස්කල් ජයමාන්න**
**උස්වැටකෙයියාව.**

# ගරු ඇලෝසියස් පීරිස් පියතුමා
# ආසියානු විමුක්ති දේවධර්මයේ මග සලකුණ



ශ්‍රී ලංකාවේ එතෙක් මෙතෙක් බිහි වූ අති විශිෂ්ටතම කතෝලික විද්වතාණන් ජේසු නිකායික ගරු ඇලෝසියස් පීරිස් පියතුමා බව නිසැකවම පැවසිය හැකි ය. ශ්‍රී ලාංකීය කිතුනු ඉතිහාසය තුළ පමණක් නොව, ගෝලීය දේවධර්මීය ක්ෂේත්‍රය තුළ ද "ඇලෝයි පීරිස්" නාමය නොමැකෙන සටහනක් තබා ඇත.

එතුමා හුදෙක් ආගමික වතාවත්වලට පමණක් සීමා නොවී, ආසියානු අනන්‍යතාවයකින් යුත් දේව ධර්මයක් ගොඩ නැගීමට කැප වූ අසහාය චින්තකයෙකි. ක්‍රිස්තු ධර්මය සේ ම බුද්ධ ධර්මය පිළිබඳව ද ලොව ඉහළ ගණයේ වියතෙකි. අන්තර් ආගමික සංවාදයේ පුරෝගාමියෙකි. සිංහල, සිංහල සාහිත්‍යය, පාලි, සංස්කෘත, ලතින් භාෂාවලට අමතරව ශුද්ධ බයිබලයට පාදක වන හීබෲ, ග්‍රීක, අරමයික් භාෂා පිළිබඳව ද ප්‍රවීණයෙකි. රෝමයේ ග්‍රෙගෝරියන් විශ්වවිද්‍යාලය ඇතුළු, පෙර-අපරදිග විශ්වවිද්‍යාල රැසක බාහිර කථිකාචාර්යවරයෙකි; ආරාධිත දේශකයෙකි. කලක් ආසියානු රදගුරු මණ්ඩල සම්මේලනයේ උපදේශකයෙකි. තවත් විටෙක අති උතුම් (ශුද්ධ වූ) හයවන පාවුලු පාප්තුමන් විසින් පත් කරන ලද අන්‍යාගම් පිළිබඳ විශේෂ උපදේශක කණ්ඩායමේ ද සාමාජිකයෙකි. ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් පාලි සහ සංස්කෘත භාෂාව පිළිබඳ ගෞරව උපාධිය ද, විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් බෞද්ධ දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධියක් ද. කැලණිය විශ්වවිද්‍යාලයෙන් ලද සාහිත්‍ය සූරී ගෞරව උපාධියකට ද හිමිකරුවෙකි. ඒ සියල්ලට ම වඩා අව්‍යාජ ගුණදම්වලින් පිරී වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම, සැබෑ මනුෂ්‍යයෙකි.

මා අම්පිටිය නි.ම.නි. දෙව්සත්හල් ශිෂ්‍යයෙකුව සිටිය දී, ආසියානු දේව ධර්ම ආයතනය (Asian Instiute of Theology) නමින් ප්‍රායෝගික අධ්‍යයන වසරක් අප පැවිදි පූජක පුහුණුවට ඇතුළත් කෙරිණි. මට ඇලෝයි පියතුමාව මුල් වරට හමු වන්නේ ඒ කාලයේ දී ය. එතුමන් විසින් ස්ථාපිත කැලණිය "තුලන" පර්යේෂණ මධ්‍යස්ථානය තුළ අප දෙව්සත්හල් සිසුන් ලෙස අන්තර් - ආගමික සංවාදය, ලාංකීය පැවිද්දන් ලෙස බෞද්ධ දර්ශනය හැදෑරීමේ වැදගත්කම, පැවිදි වේදිකාරයන්හි ගැඹුරු දේවධාර්මික හරය වැනි විෂයයන් ගැන ඇලෝයි පියතුමන් සමග සිදු කළ අපූරු සංවාද මට අද මෙන් මතකයේ රැඳී තිබේ. අම්පිටිය ජාතික දේව ධර්ම ශාස්ත්‍රාලයෙන් ලබාගත නොහැකි වූ ඇතැම් මානයන් එහි දී ලබාගත හැකි වූ බව නම් පැවසිය යුතු ම ය. එතැන් සිට විටින් විට මම එතුමන්ව මුණ ගැසීමට "තුලන"ට ගියෙමි. වර්තමාන සමාජ සන්දර්භය තුළ සේවය කිරීමට අවශ්‍ය අවබෝධය උගතිමි. 2013 වර්ෂයේ මගේ විදෙස්ගත වීමෙන් පසුව අපගේ කතාබහ විද්‍යුත් පණිවුඩවලට සීමා වූවත්, නිවාඩුවට පැමිණි කිහිප වතාවක ම මම එතුමන්ව හමුවීමට අමතක නො කළෙමි. මරණයට මසකට පෙර අප හමු වූ මොහොතේ, මේ හමුවන්නේ අවසන් වතාවට බව දැන සිටියා නම්...?

ඇලෝයි පීරිස් පියතුමා ලොවට හඳුන්වා දුන් ප්‍රබලතම සංකල්පය වන්නේ "ආසියානු විමුක්ති

දේව ධර්මය" යි. බටහිර දේව ධර්මය ඒ අයුරින් ම ආසියාවට ආදේශ කිරීම වෙනුවට, ආසියාවේ පවතින "මහා ආගමික සම්ප්‍රදායන්" සහ "මහත් වූ දිළිඳුකම" යන සාධක දෙක පදනම් කරගෙන දේව ධර්මය අර්ථකථනය කළ යුතු බව එතුමා පෙන්වා දුන්නේ ය. එතුමාගේ ඉගැන්වීම්වලට අනුව,

- කිතුනු දහම අනෙකුත් ආසියානු ආගම් (විශේෂයෙන් බුදුදහම) සමග ගැඹුරු සංවාදයක නිරත විය යුතු ය.
- සැබෑ ආධ්‍යාත්මිකත්වය පවතින්නේ දිළිඳු ජනතාවගේ පීඩනය හඳුනා ගෙන ඔවුන්ගේ විමුක්තිය වෙනුවෙන් පෙනී සිටීම තුළ ය.

"An Asian Theology of Liberation", "Love Meets Wisdom", Fire and Water" වැනි ජාත්‍යන්තර අවධානයට ලක්වූ තම කෘති හරහා එතුමා පෙන්වා දෙන්නේ ආගම යනු පුද්ගලික ගැලවීමක් පමණක් නොව, සමාජීය සාධාරණත්වය උදෙසා වූ මෙවලමක් විය යුතු බව ය. ජාත්‍යන්තර මට්ටමේ විද්වතෙකු වුව ද, ඇලෝයි පියතුමා ඉතාමත් සරල ජීවිතයක් ගත කළ අයෙකි. "තුලන" මධ්‍යස්ථානයට යන ඕනෑ ම අයෙකුට දැකිය හැක්කේ පොත්පත් පිරි කාමරයක, ඉතා සාමාන්‍ය අයුරින් වෙසෙන පියතුමෙකි. තමා සතු විශාල දැනුම හෝ කීර්තිය අන් අයව යටපත් කිරීමට එතුමා කිසි විටෙකත් භාවිත නො කළ බව දන්නෝ දනිති.

ඇලෝයි පීරිස් පියතුමා යනු ආගමික සීමාවන් ඉක්මවා ගිය මානව හිතවාදියෙකි. එතුමා, බුද්ධිමතුන්ට මෙන් ම සාමාන්‍ය ජනතාවට ද එක සේ සමීප වූ චරිතයකි. ඇලෝයි පිය ජීවිතය අපට කියා දුන් ඒ පාඩම - ශ්‍රී ලාංකීය අනන්‍යතාවකින් යුත්, දුප්පතුන් වෙනුවෙන් හඬ නගන සජීවී සභාවක අවශ්‍යතාව තවමත් දැඩි ලෙස තිබෙන බව, අවසන් වශයෙන් කිව යුතු ම ය.

ගරු ශානිල් ජයවර්ධන නි.ම.නි. පියතුමා

## බලා හිඳීම් - බලාපොරොත්තු දැල්වා !

තිඹිරි ගෙය වූව ද ගවහල එදා
පිදුරු - ගොම රිටි - ගව - බැටළු කැල අසල
පතිනියක් - මවක වූ අරුමැතිය
දරා ගත්තීය ඕ ඇඳහිල්ලෙ බැති හදින්

අග හිඟ ද මතු වෙද්දි 'වඩු' ගෙදර
හුරු පුරුදු සරල බව හමුවේ දී
තබා ගෙන දරු සෙනෙහෙ - ඉදිරියෙන්
'සුදු පවුල' රැක ගත්තීය අබිමනින්

'දෙව් පුතුගෙ - මව වීම්' දෙව් වරමින්
තව තවත් බැහැපත් ව දිවි ගමන
ගෙන ගියේ වී පරම ආදර්ශයක්
දෙව් සැලසුමට දී දිවියෙ සැම ඉඩක්

ගෘහනියක හා සහෘදිනියක විලසින්
කානානි විවාහ මංගල ගෘහයෙ දී
දයාර්ද්‍ර ව දෙව් පුතුට කළ ආයාචනය
එල දැරුයේ පද පළමු පෙළහර ම

හමුවෙද්දී පුතු කල්වාරි ගිර අබියස දී
මහා බර කුරුසියක් උර දරා
රුහිරු වගුරවමින් පුතු - නැගිටිද්දී වැටි වැටී
ඉසිලුවේ කෙලෙසින් ද ඔය මවු හදින්!

ඇණ ගසා කුරුස කඳ මත්තෙ දී
දිවි පිදූ අදර පුතුගේ සිරි ගත
ගෙනැ දෝතින් - තබා ගෙන උකුල් යහනේ
වැලපෙමින් - 'පළි නොගැසූයේ' කිම් දැයි දනිම්

දෙව් පිය සැලසුමට අවනත ව නිති දා
ලෝ දනන්ගේ විමුක්තිය පතමින්
දැරූ මහ දුක් - බලාපොරොත්තුව පිරී හදින්
ලොව ප්‍රථම හා එක ම අම්මා ඔබ බැව් දනිමි!

තිර වූ විශ්වාසයේ මුල් ම ආරම්භය
'බලාපොරොත්තුව' ම බව පසක් වේ
ප්‍රේමයට දක්වන්නට ප්‍රති ප්‍රේමය ම
ඉගෙන ගන්නෙමි සග මවේ - මම ඔබගෙන් ම

නීටා අයි. ප්‍රනාන්දු, කඳාන.

# අහිමි නොවූ ආදරයක් (කෙටි කතාව)

"පාන්දර එක යි. නිලාල් තවත් නෑ..."

ජයනි නැගිටල ඇඳේ ම වාඩි වුණා. නින්ද නම් අහලකවත් නෑ වගේ. මුළු කාමරය ම සන්සුන්. ඒ අතරින් නොසන්සුන් ලෙස දුවන ඔරලෝසුවත්, ජයනිගේ හිතත් එක වගේ ම යි කියල ඇයට හිතුනා. ජයනිගෙ කාමරේ උස කනප්පුවක් උඩ තමා තිබුණු මරියතුමියගේ සුරුවම දෙස ජයනිගේ ඇහැ ගියේ ඉබේට ම යි. "අනේ ජේසු අම්මේ... ජයනිට කියවුණෙත් ඉබේට ම යි. ඉතා සන්සුන් ලෙස ජයනි දිහා ම බලාගෙන හිටි ජේසු අම්මාගේ බැල්ම, ජයනිගේ කලබල සිත මොහොතකට වෙනස් කළා. මේසේ උඩ තිබුණ උණු වතුර බෝතලෙන් කෝපි ටිකක් බොන්න ඕනේ කියල ජයනිට හදිසියේ ම හිතුණා. නිලාල් ආවහ ම එයත් එක්ක ම බොන්න බැරියැ. ජයනිට ආයෙත් හිතුණා. නිලාල් මෙච්චර පරක්කු වෙන්නෙ ඇයි? ජයනිට ආයෙත් හිතුණා. යාළුවො එක්ක එකතු වුණා ම ඔහො ම තම යි ගෙදර මතක නෑ.

මේසෙ උඩ තිබුණ නිලාල්ගේ පින්තූරෙ ජයනි දිහා දුකෙන් බලාගෙන ඉන්නවා. ඒක ජයනිට නිලාල් දුන්න පළමුවෙනි ම තෑග්ග. ඒ දවස්වල, ඒ කියන්නේ මීට අවුරුදු 4කට විතර ඉස්සර ජයනි ඒ පින්තූරේ පරිස්සම් කළේ පුදුම ආදරයකින්. ඒ කාලෙත් දැනුත් අතර කොච්චර වෙනසක් තියෙනව ද? ජයනි තව ටික දවසකින් අම්මා කෙනෙක්. එතකොට ජීවිතේ තවත් වෙනසක්. 'එන්න එන්න ම ජීවිතේ වෙනස් වෙවී යන හැටි' ජයනිට හිතුණා. ජයනිගෙ හිත එයාටත් හොරා ම අතීත මතක සටහන් අතරින් හොරෙන් හොරෙන් රිංගුවා. නිලාල් හමු වූ පළමු දවස... ජයනිට අද වාගේ මතක යි. ඒ දවස ගැන ජයනිට සිහින් සතුටක් වගේම ලැජ්ජාවකුත් හිතෙනවා. එදා කොච්චර ලජ්ජාවෙන් ද නිලාල් එක්ක කතා කළේ. තොල් වෙව්ලපු හැටි මතක් වෙනකොට ජයනිට දැනුත් ලජ්ජ යි. අවුරුදු තුනක විතර ඇසුරකින් පසුව දෙමාපියන්ගේ ආදරය මැද්දේ ගමේ දේවස්ථානයේ දී තමයි ජයනියි නිලාලුයි එකතු වුණේ. පහුගිය කාලේ ගැන මතක් වෙනකොට ජයනිට ආයෙත් ඒ කාලෙට දුවන්න හිතෙනවා.

ජයනි ආයෙත් කොට්ටෙට ඔළුව තියාගත්තෙ නිදන අදහසින්. ඒත්, තමා ළඟින් ම තියන නිලාල්ගේ කොට්ටෙ දිහාට ජයනිගෙ දෙනෙත් යොමු වුණේ ඉබේට ම යි. ජයනි නිලාල්ගෙ කොට්ටේ හෙමින් සැරේ තමා වෙතට ළං කර ගත්තා. ඉස්සර වගේ නෙවේ, නිලාල් දැන් හරි අමුතු යි වගේ. ජයනිට සුසුමක් පිට වුණා. දැන් මාව නිලාල්ට අගේ නැතිව ඇති. මම දැන් ළඟ ම ඉන්නවනේ.

"අනේ මටත් යන්න තිබුණ නම් තොරන් බලන්න... නිලාල්ගේ අතින් අල්ලගෙන තොරන් දිහා පැය ගානක් බලාගෙන ඉන්න තිබුණා. ඒත් මමනේ යන්න බෑ කීවේ..." ජයනි හිතුවා. "නෑ... ඒත් නිලාල්ට තිබුණා මාව කොහොම හරි එක්ක ගෙන යන්න..." හීං කඳුළු කැට දෙකක් ජයනිගේ කම්මුල් තෙමා ගෙන පහළට රූටලා කොට්ටෙට උරා ගත්තා. ජයනිට ඉකි ගැහුණේ ඉබේට ම යි. කුස්සි අම්මට ඇහෙයි කියල ජයනි බොහො ම අමාරුවෙන් නිහඬ වෙන්න උත්සාහ කළා.

"ජයනි... විකීලා තොරන් බලන්න යනව ලු. අපිත් යමු ද?" නිලාල්ගේ යෝජනාව ජයනිට මතක යි.

"අනේ නිලා... මට හොඳ නැතිව ඇති නේද...? රෑ නිදි මරන්නත් වෙයිනේ..."

"ඔව්... නේ... මට අමතක වුණානේ"

"මම නොගියාට මොක ද ඔයා යන්න"

"ඔයා තනියමනෙ කෙල්ලේ"

"මට තනි නෑ... ඇයි කුස්සි අම්මා ඉන්නෙ"

හවස නිලාල් කන්තෝරු ගිහිල්ලා ආ හැටියෙ ම ජයනිට කිවූ දේත්, ඒවාට ජයනි දුන් පිළිතුරුත් ඇය නැවත නැවත මතක් කළා. ජයනි ඒ එකින් එක ගළපලා බැලුවා.

"නිලාල්ට තිබුණ යන්නෙ නැතිව ඉන්න. එයා ගියේ මං ගැන ආදරයක් නැති නිසා යි."

අන්තිමේ දී ජයනි තීරණය කළේ එහෙම යි. ඒ තීරණය උඩ ජයනි හුඟාක් දේවල් හිතුවා. නිලාල් මං ගැන හිතන්නෙ නැතිව ඉදිරියටත් එහෙම ගමන් යයි ද? එයාට ටිකෙන් ටික මාව එපා වෙයි ද? ඊට පස්සේ...

"ඇයි නිලා මාව තනිය ම දාලා ගියේ?" ජයනි නිලාල්ගේ කොට්ටෙට මූණ ඔබාගෙන හීං හඬින් කෙඳිරුවා.

"ජයනි..."

නිලාල්ගේ කටහඬ ජයනි අඳුන ගත්තා. ඒත් ඇඳෙන් නැගිටින්න තරම් ජයනිට හිතුණෙ නෑ. නිලාල් කීප සැරයක් කථා කළාට පස්සෙ ජයනි හෙමින් සැරේ දොර ගාවට ගියා. අඩවන් වූ දොර පළුවෙන් මැත් වූ නිලාල් ඇඳුම් අහවර කර ඇඳට වැටුණේ තෙහෙට්ටු ගතියකින්. නිදිබර වූ ඒ දෑස් ජයනි දිහාට යොමු කරන්න නිලාල්ට මතකත් නෑ. ඒ තරමට ම මහන්සි යි.

"තොරන් හුඟක් තිබුන ද නිලා?"

"හ්ම්"

"හුඟක් සෙනඟත් හිටිය ද?"

"හ්ම්"

"කවුරු කවුරු ද ගියේ නිලා?" ජයනි ටිකක් උස් හඬින් ඇහුවා.

"මට නිදිමතයි ජයනි... හෙට සේර ම කියන්නම්"

නිලාල් ඇඳේ අනෙක් පසට හැරුණා. ජයනි නිලාල් දිහා ටික වේලාවක් බලාගෙන හිටියා. කෝපි ටිකක් බිව්වොත් හොඳයි කියලා ජයනිට හිතුණ නිසා, නිලාල්ගේ ඇඟට අත තියලා කතා කළා. නිලාල් එයට පිළිතුරු දෙන්න අවදියෙන් හිටියෙ නෑ. ඔහුට ඇඳට වැටුණු හැටියේ ම නින්ද ගිහිල්ලා. කෝපි ටිකක් බොන්න ඕනෙ කියන සිතුවිල්ලත් ජයනිගෙ සිතෙන් හිමින් සැරේ දිය වෙලා ගියා. මේසේ උඩ තිබුණ නිලාල්ගේ පින්තූරෙ නම් තාමත් ජයනි දිහා ම බලා ගෙන ඉන්නවා. ඒ පින්තූරෙ ඉන්න නිලාලු යි ඇඳේ ඉන්න නිලාලු යි සසඳන්න බැරිව වගේ ජයනි මාරුවෙන් මාරුවට දෙදෙනා දිහා ම බැලුවා. ඒ දෙදෙනා අතර වෙනසක් තියෙනවා කියලා ජයනිට අන්තිමට හිතුණා. ඒ පින්තූරෙ හිටිය ඉස්සර නිලාල් නෙවේ දැන්... දැන් නිලාල් හරි වෙනස්. නිලාල් යන්තමට ගොරවනවා ජයනිට ඇහුණා. එයා නම් හොඳට ම බුදි... ඒත් මම...? ජයනිට එක පාරට ම හයියෙන් ඉකි ගැහුණා.

නිලාල් ගැස්සිලා ඇහැරුණා. කොට්ටෙට මූණ තද කරගෙන ඉකි ගහන ජයනි දිහා නිලාල් බැලුවෙ පුදුමෙන් වගේ.

"ඇයි මොක ද ජයනි?" නිලාල් කලබලයෙන් ඇහුවා. නිලාල් ජයනිගේ මූණ උඩට උස්සලා තමා දෙසට හරවන්න උත්සාහ කළා. ජයනි ගස්සලා මූණ අහකට ගත්තෙ ඇයි කියලා නිලාල්ට හිතාගන්න බැරුව ගියා. නිලාල්ට කිසි දෙයක් තේරුණෙ නැහැ. ඒත් ජයනි තමා සමඟ මොකක් හෝ අමනාපයක් ඇති කියලා නිලාල්ට යන්තමට සැක හිතුණා. ඒත් තමා අතින් කිසි ම වරදක් නොවුණ බවත් ඔහුට විශ්වාස යි.

"මොකද... ඔයාට මේ වෙලා තියෙන්නේ?"

"මට මොකුත් වෙලා නෑ" ජයනි බිම බලාගෙන ම කිව්වා. මිනිත්තු කීපයක නිහැඬියාවක්. ඔරලෝසු බට්ටා නම් ඒත් නැවතිලා නෑ.

"මම බයේ හිටියේ... ඇයි ඔයා මෙච්චර පරක්කු වුණේ?" ජයනි හෙමින් හෙමින් තැතනුවා.

"ඇයි කුස්සි අම්මා හිටියේ බය වෙන්න දෙයක්යෑ...?" නිලාල් ගාණක් නැතිව කියා ගෙන ගියා.

"ඔයා ඉස්සර නං ඔහො ම මාව දාලා යන්නෙ නෑ නිලා..." ජයනි කඳුළු අතරින් මොන මොනවා දෝ කියා ගෙන ගියා. නිලාල් ජයනි දිහා බැලුවා. තොරන් බැලුවත් හැම අවස්ථාවෙ ම ජයනිව මතක් වුණ හැටි දන්නෙ නිලාල් විතර යි. ඒත් තමාට යන්න කියලා කිවූ ජයනි ම තමාගේ ගමන ගැන අමනාපයක් ඇතිකර ගැනීම ගැන නිලාල්ට පුදුම යි.

21 වන පිටුවට ...

රමණී ජයන්ති පෙරේරා
කැපුන්ගොඩ.

# හිමිදිරි උදයක



හිමිදිරි උදයක,
හමනා මඳ සුළඟක් මැද,
ලියන්නට සිතුණි,
අම්මේ නුඹ ගැන,
මතකයට නැඟී නුඹේ ඒ සිනාව.

හිත සනසාලන ඒ රූපය,
නුඹ ම වේ අම්මේ.
මා ජීවයට පණ පෙව්වේ
නුඹ ම තමා අම්මේ.
අඳුරේ අතපත ගාමින්,
එළියක් සොයනා විට,
පහන් ටැඹක් රැගෙන,
මා පසුපස සිටියෙත්
නුඹ නොවේ ද අම්මේ.
නෙතින් වැටෙනා සෑම කඳුළක් ම පිසදා,
සිනාවක් එක් කළේ
නුඹේ ආදරය නේ ද අම්මේ.
මගේ ජීවිතයේ වටිනාම දේ වුණෙත්
නුඹ යි දේව අම්මේ.

සෙව්වාට ලස්සන ලොවක්,
නුඹගේ ආදරෙන් එහා,
නො දුටුවෙමි එවැනි ලොවක්
නුඹගේ ආදරයෙන් එහා,
ඒ සොයනා ලස්සන ලොව ඇත්තේ
නුඹගේ ආදරය තුළ පමණ යි
එය දනිමි මා ඉපදුණ දා සිට ම
දැනි නුඹගේ අසීමිත ආදරය
අම්මා...

විඳින්නට නුඹේ ආදරය සදා
තවමත් සොයන්නේ නුඹගේ
තුරුල නොවේ ද මා...
කිසිවක් නැති වුණත්
මා හටා,
සිටියොත් ඇති අම්මේ
නුඹ පමණක් සදා...

වේදනා විඳිනා විටදි මා,
සුවය ගෙනෙනා අම්මා.
සැමදා ම සනසා මා ළඟ හිඳ
ආදරය දුන් අම්මා.
කෙසේ යන්න ද නුඹේ ආදරෙන්
එහා අම්මා,
මං ආදරෙයි නුඹට හැම දේට ම
වඩා අම්මා...
ඇති වුණේ සිතට සතුට යි,
දැක නුඹේ ඒ සිනාව අම්මා
වුණෙමි නුඹ සැමදා
තවත් බලාපොරොත්තුවක්
මගේ නව ජීවයටා.

ජීවයට පණ පොවනා
අනාගතය පහදනා
සැම දා ළඟ ඉන්නා
බලාපොරොත්තුවේ අම්මා
නුඹ ම යි ඒ සදා...

**ජනිත් ශාමින්ද**
**දිව්‍ය හෘදයේ ආධුනිකාරාමය,**
**සිදුපියනිල, බණ්ඩාරවෙල.**

# ජපමාලයේ වැදගත්කම

දිව්‍ය පූජාව, දේව ප්‍රසාද නිධාන, යාම යැදුම යන දේව වන්දනාවලට පසුව, ඉහළ තැනක් ලැබෙන්නේ දිව්‍ය සත්ප්‍රසාද ආශීර්වාදය සහ ශු. ජපමාලයට යි. අභිරහස් මෙනෙහි කරමින් ජපමාලය යාච්ඤා කරන විට, ජේසුස් වහන්සේගේ පාස්කු අභිරහස මෙනෙහි කරමින් යාච්ඤා කරමු.

<u>ශුද්ධ වූ ජපමාලයේ අඩංගු යාච්ඤා</u>

ශු. ජපමාලයේ අඩංගු සියලු ම යාච්ඤා දෙවි පියාණන් වහන්සේ ද, පුත්‍රයාණන් වහන්සේ ද, ශුද්ධාත්මයාණන් වහන්සේ ද සමඟින් සම්පාදනය කර ඇත. කතෝලිකයන් ලෙස අප, විශ්වාස කළ යුතු කරුණු 8ක් පෙර දැරිව විශ්වාස ලක්ෂණය උච්චාරණය කරමු. 'පිතා පුත්‍රයා' යාච්ඤාව, ජේසුස් වහන්සේ ඉපදුණු අවස්ථාවේ දෙවි පියාණන් දේව දූතයන් මඟින් ගැයූ ගීයකි. ශුද්ධ ත්‍රිත්වයට කෙරෙන යාච්ඤාව යි (ලූක් 2:14). 'ස්වර්ගයේ වැඩ සිටින' යාච්ඤාව ජේසුස් වහන්සේ ම ඉගැන්වූ සේක (මතෙව් 6:9-13).

නමෝ මරිය යාච්ඤාවේ පළමු කොටස ගාබ්‍රියෙල් දේව දූතයා මඟින් දෙවියන් වහන්සේ මරිය තුමියට කථා කළ වචන යි. "විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගල වේ" (ලූක් 1:28) "ඔබ වනිතාවන් අතර අතිශයින් ආශීර්වාද ලද්දී ය" (ලූක් 1:41-42) එළිසබෙත් තුමිය පැවසූ වචන ය. මරිය තුමිය ශු. ත්‍රිත්වයේ පළමු ජීවමාන වාසස්ථානය වේ. පළමු වරට දෙවි පියාණන් වහන්සේ, දේව පුත්‍රයාව තැබුවේ මරිය තුමියගේ කුසයෙහි ය. එම නිසා මරිය තුමිය ලොවේ පළමු දිව්‍ය සත්ප්‍රසාද කරඬුව වන සේක. දේව පුත්‍රයාණන්ව පළමු වතාවට තම දෝතින් රඳවා ගත් නිසා එතුමිය පළමු අල්තාරය වන්නී ය. තම ඥාතිවරිය වන එළිසබෙත් තුමිය බැහැ දැකීමට ගිය ගමන පළමු දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර යි. ජපමාලයේ පළමු නමෝ මරිය තුන මරිය තුමිය හා ශු. ත්‍රිත්වයේ සම්බන්ධය මෙනෙහි කරයි.

ජීවිතයේ නොයෙක් දුක් කම්කටොළු, කරදර, සුසුම්ලැම්වලින් අන්ත අසරණව පීඩාවට පත් ජනතාවට, දෙවි මව්ගේ අනුකම්පා සහගත මැදිහත් වීම "මංගල්‍යස්තු රාජේශ්වරියනි, කර්ප දයා මාතාවෙනි" යාච්ඤාව මඟින් සිදු වේ. ශු. ත්‍රිත්වයට හා දිව්‍ය සත්ප්‍රසාදයට කරන යාච්ඤාවක් හෙයින් ජපමාලය උච්චාරණය කරන සෑම මොහොතක ම මනුෂ්‍යයාගේ කඳුළුවලට සැනසීම දීමට මරිය තුමිය ඉතා ආශාවෙන් බලා සිටින බව අමතක නො කරන්න.

**ලැරින් ප්‍රියානි**
**පහළ දුම්මලසූරිය.**

# යදිනු මැන අම්මේ

සශ්‍රීකත්වයෙන් හෙබි නාසරෙත්හි දෙවිඳුන්ට කැපව ජීවත් වූ ආනා සහ ජුවකීනු යන දෙදෙනාට දාව මෙලොව එළිය දුටු දෙවියන්ට ප්‍රිය ලෙස ජීවත් වූ යහපත් දියණියක් විය. ඇය නමින් මරියා ය. මරියා ක්‍රම ක්‍රමයෙන් වැඩෙත් ම ඇය රූමත් තරුණියක් වූවා ය. ඇය තුළ තිබූ දේව ගරු බිය, දෙවියන් වහන්සේට කැප වූ පිරිසිදු ජීවිතය, කොතරම් ද කිවහොත් ඇය ඉමහත් භක්තියකින් දේව කැමැත්තට හිස නැමී ය. එයින් ඇය දෙවියන් වහන්සේගේ කුමාරිකාව වූවා ය. ඉන් පසු දේව පණිවිඩය තුළ වූ ශුද්ධාත්මානුභාවය අත්දකිමින් දැඩි ඇදහිල්ලෙන් සහ මහත් විශ්වාසයෙන් දිවි ගෙවූ හෙයින් ඇය ස්ප්‍රීතු සාන්තු වන දෙවියන් වහන්සේගේ ප්‍රිය කාන්තාව වූවා ය. ඉන් පසු දෙවියන් වහන්සේ ආදි මව්පියන්ට දුන් පොරොන්දුව ඉටු කිරීමට එවූ ගැලවුම්කරුවාණන් කුරුසියේ දුක් විඳ මරණයට පත් වූ විට ඇය පුත්‍ර වූ දෙවියන් වහන්සේගේ මාතාව වූවා ය.

32 වන පිටුවට ...

**ජේ. එල්. සඳුනි වාසනා පීන්තු**
**12 ශ්‍රේණිය,**
**ශු. පවුලේ බාලිකා ම. වි., වෙන්නප්පුව.**

# මේ අහන්න...

අම්මා යන අකුරු තුන ම හඳුනන්නැති කෙනෙක් නැතේ
අපි මෙලොවට බිහි කරන්න වෙන කවුරු ද වැය වූයේ
දෝත් මුදුන් දී වැඳ වැඳ පුදමු අම්මලා පොළොවේ
අපේ ආයුෂත් අරගෙන ජීවත් වෙනු මේ ලෝකේ

ලේලී හබය දුර දිග ගොස් අම්මා හැම හැර යන්නේ
අම්මා වැරදි වුවත් මොට ද එසේ යන්න ඉඩ හැරියේ
සුළු දෙයකට මහ මෙර සේ පන්නා පන්නා දෙස් දෙන්නේ
එවන් දරුවෝ හිත්පිත් නැති අමනුෂ්‍යයෝ ම යි වන්නේ

හෙළූ ඩහදිය ගලපු කඳුළු රුධිරයෙනුයි ණය ගෙව්වේ
එවන් මවක් හට කවුරු ද අතක් පයක් ඔසවන්නේ
සිතට වේදනා දුන්නොත් ආපහු අප වෙත එන්නේ
කවදා හරි ඒ දඬුවම විඳලා ම යි මිය යන්නේ

මහලු මඩම් ඇති තරමට ඇයි රට පහළට වැටුණේ
අසරණ වැඩිහිටියන් හට වෙන පිළිසරණක් නැත වූයේ
සැප සම්පත් විඳිනු කුමට මව් හිඟමනේ යන අතරේ
එවන් දරුවෝ හැම දෙනාට නිරය ම යි හිමි වන්නේ

කුණු මල්ලක් විලසින් මව මහ පාරට විසි වන්නේ
තිරිසන් සත්තු වත් නෑ මේ විදියට සලකන්නේ
මොන හිතකින් කරමු ද මහ අපරාධය මේ විලසේ
දඬුවම් ලබනා දවසක් අත ළඟට ම පැමිණෙන්නේ

බලාපොරොත්තුවේ අම්මා සුදු පවුල ම එළිය කළේ
සරල බවින් දෙව් වදනට කීකරු වී දිවි ගෙව්වේ
සුරැකි පියා පුතු සමඟින් ලස්සන ගමනක් වූයේ
අපිත් අපේ අම්මාලාට පින් දී ගෙන ඉඳිමු අනේ

රූපස් ප්‍රැන්සිස්

අහිමි නොවූ ආදරයක් (කෙටි කතාව), 17 වන පිටුවෙන් ...

ඒත් ජයනි ගැන නිලාල්ට ඇති වුණේ වේදනාවක්.

"ඇයි ළමයෝ, ඔයා ම නේ මට යන්න කීවේ" නිලාල් ජයනිගෙ මූණ තමා දෙසට ළං කර ගනිමින් කීවා. ජයනි හෙමින් හෙමින් ඔළුව උස්සලා නිලාල් දිහා බැලුවා. ඒත් ජයනිට කතා කර ගන්න බෑ. වචන හිර වෙලා.

"මට සමාවෙන්න නිලා..." ජයනි හෙමින් හෙමින් කෙඳිරුවා.

"පිස්සු කෙල්ල... මට යන්න එපා කියලා කීවනම් මම යන්නෙ නැහැනේ"

"දෙයියනේ මගේ රත්තරං නිලා... මම ඔයා ගැන හිතපු දේවල්..." ජයනිගේ හදවත මොර දෙනවා. නිලාල් ජයනිව තමා දෙසට ළං කර ගත්තා. ජයනි ආයෙත් නිලාල් දිහා බැලුවා.

"අවුරුදු හතරකට ඉස්සෙල්ලා නිලායි දැන් නිලායි අතර කිසි ම වෙනසක් නෑ" කියලා ජයනිගෙ හදවත ජයනිට කෑ ගහලා කිව්වා. ජයනිලගෙ කාමරේ උස කනප්පුවේ මල් ගොඩක් මැද හිටිය දේව අම්මගෙ පිළිරුවක් දෙන්නා දෙස බලාගෙන හිනා වෙනවා ඈ යන්තමට දැක්කා.



## ජෝසංගපාල ආර්චි ජ්‍යෙෂ්ඨයාණෙනි !

කිතුනු ලේඛක පරපුරේ
දැවැන්තයකු වූ ඔබ
'භක්ති ප්‍රබෝධනයට'
ලබා දුන් ශුද්ධවූ බයිබලීය
දහම් දැනුම ඉමහත් ය.
ඔබ ලියූ - කියූ දේ
මතකයේ රැඳී පවතී.

ඔබ ආත්මයට
දෙවිඳු වාස භවනේ
හිමිකම ලැබේවා !

**සංස්කාරක පියතුමා සමඟ**
**'භක්ති ප්‍රබෝධනය' පවුලේ අපි**

# ප්‍රසන්න වූ අම්මා

තුරු වදුලෙහි මල් පිපෙමින් සැරසෙන්නේ කුමකට දෝ
ඒ සුන්දර මැයි මාසය පිය දෙවිඳුගෙ සැලසුම දෝ
මල් මාලා ගොතමින් අපි මරිය මවුන් සරසමු දෝ
ජපමාලය සමඟින් අපි දොරින් දොරට එක් වෙමු දෝ

ලූර්දුවෙහි, මෙජිගෝරයෙහි, පාතිමාවෙ අපෙ අම්මා
ලොව නන් දෙස තම දරු කැල රකිනට එන මරි අම්මා
සුරලොව මනුලොව දාමයකින් එක් කළ අම්මා
ජේසු පුතුන් වෙත අප ගෙන යන බලාපොරොත්තුවෙ අම්මා

බලාපොරොත්තුවෙ මුල් පියවර තැබුවේ කානා නුවර යි
මෙතුමාණන් කියන දෙයක් කරන්න කිව්වේ ඇය ම යි
මංගල සාදයෙහි සතුට රැක දුන්නේ ඇගෙ වදන යි
සාම සතුට පවුල්වලට ගෙන දෙන්නේ මව් පෙම ම යි

පිය දෙවිඳුගෙ එක ම පුතා අපට තිළිණ කළ අම්මා
පාප මලින් අප මුදන්න පුතු හට දිරි දුන් අම්මා
සැම දුක් ගිනි දරාගන්න ආදර්ශය වූ අම්මා
අප සැම බැතියෙන් පසසමු බලාපොරොත්තුවේ අම්මා

ගාබ්‍රියෙලුන්ගේ ඇරයුම හදවතින් ම වැලඳ ගත්ත
දිව්‍ය පූපයේ කරඬුව පළමුවෙන් ම දරා ගත්ත
කුරුස ගසෙන් ආ ඔවදන ඉත සිතින් ම බාර ගත්ත
මරිය මවුන් සමඟින් දිනයක දකිනෙමු දෙව් පිය සිරි වත

**අයිරින් කොස්තා, කඳවල.**

# MARY; THE MOTHER OF HOPE

We honour Mother Mary with the title "Mother of Hope" (Spes Nostra). It is not just a pious salutation, but this theological reality is deeply connected with the human condition in our society. For decades, from the ethnic conflict to current economic drawbacks, people in our country have been standing at the edge of darkness. The whole society has been waiting with hope for the dawn of a new age for many decades.

The Hope that Mother Mary demonstrates is not mere optimism. She does not pretend that pain is unreal. Our heavenly mother knew and experienced immense pain. This was foretold to her by the old Simeon at the temple (cf. Luke 2:35). Although the pain of seven swords piercing the heart was experienced by Mother Mary, she remained prayerful and unwavering. In Mary, we find not a majestic and distant queen but a humble mother who understands our broken situation.

Hope of Mary was not just the optimism that "things will get better over the time", but her hope was deeply rooted in the faithfulness towards God. At the Annunciation by Angel Gabriel, she faced an impossible situation. But her response was "May it be done to me according to your word" (Luke 1:38). This was her great Fiat which dawned God's salvation to human civilization. In our social context today, we have the challenging task of rebuilding our fractured economy and the divided social fabric. In this context, Mary teaches us that hope begins with "Yes" to the providence of God, even if we are unaware about our route in the journey ahead.

As we look at the MagniÞcat of Mary, it is not another hymn of personal piety. But it manifests the justice of God. She states that God would scatter the proud and lift up the lowly and fills the hungry with good things (cf. Luke 1:51-53). In Sri Lankan context we find mothers in the North who had lost her children due to war, fathers in the South who are unable to feed their family and youth in urban areas who have lost faith about their future. The Magnificat of Mary stands as a beacon of hope for all of them who are in desperate situations. When Sri Lanka is crying out for justice and integrity in leadership, Mary's hymn reminds us that God is not indifferent to the suffering of the "lowly" (Anawim). Hope is an active virtue. It calls us to work for a society where the hungry are filled and the dignity of every person is upheld.

Our Mission today in Sri Lanka, calls us to perform what Mother Mary did at Cana. To notice the dire need, even before it is announced, and bring it towards Jesus Christ. When Mother Mary told the servants, "Do whatever He tells

you" (John 2:5) she was not managing a social welfare programme. She was exercising her maternal intercession rooted in intimate trust. In our parish communities too we must be attentive to the unspoken cries of our neighbours. Mostly our faithful pray for themselves and for their family. But the Marian attitude at Cana invites us to pray for the less fortunate, drug addicts, broken families, depressed teens, desperate youth and lonely grandparents in our own parish community. Just as Mary, we are to raise their sufferings to Jesus in prayer.

Perhaps the most timely image for our nation at this moment is Mary standing at the foot of the cross. The Gospel of John records "standing near the cross of Jesus were his mother and his mother's sister" (John 19:25). Mother Mary did not flee at the face of unbearable suffering. She stood with broken heart wide open, accompanying her son through the most terrible agony. We are to stand with the innocent parents in both North and South who lost their beloved children due to ethnic conflict and political unrest. Mary at the foot of the cross calls us to accompany those whose faith was shaken due to Easter Sunday bombings. At times although we cannot offer material or financial assistance, we are called not to abandon the less privileged individuals in their sufferings. Mary's presence at the cross validates our national grief. She tells us that God is found in the midst of pain, not just in the escape from it.

Mary teaches us the greatest lesson of unwavering faith, when the dead corpse of Jesus was laid on her lap. It is portrayed in detail in the statue of Pieta by Michelangelo. Just imagine, if the only son of a single mother was brutally murdered and the dead body of that son was laid on mother's lap, would she have any faith? But Mother Mary believed that even through the dead body of her son, God can bring salvation to the world. She displayed ultimate resilience at this moment. We, Sri Lankans are also called to never to lose faith at this moment when our economy is crippled and we are being suffocated due to the war in the middle east. We are to know that God has his plan of salvation, even through the darkest moment.

Finally Mary in the Upper room, gathered all the scattered disciples of Jesus to ignite hope through continuous prayer. (Acts 1:14) She did not retire into private grief. But she ardently prayed with the community as they awaited the promise of Christ. Through this courageous prayer Mary and disciples experienced the descent of the Holy Spirit in abundance. Therefore, Mary's presence in the upper room gives us the example of unwavering hope. She is our Mother of Hope. Therefore, Let us entrust to her the struggling and broken people of our Motherland.

**Fr. Rajith Clamantha Edirisinghe**

# නීලමණීටත් වෙනම ඉඩමක්...




කාගෙ කවුරු ද කියල ඇහුව ම
ගමක් , නම , ලිපිනයක් තිබුණා
බොහෝ මිනිසුන්ගෙ නාමෙට
පර්චස් ම දෙක තුනක් තිබුණා

ගොඩ යනවා ම යෑ යි සිතා ගෙන
දේශපාලූවන් පස්සේ දිව්වා
පොදු කරාමය, වැසිකිළිය පොදු
අපා දුක් උණ් එමට විඳිලා

"නිලමණිටත් වෙන ම නිවසක්"
ගොඩක් ආසාවෙන් බලන් හිටියා
තාම බොඳ වුණු හීන කඳුළැලි
එකෙක් හෝ දැක්ක දැ යි සිතුණා

බලාපොරොත්තුවේ හීන ගුළි කර
අත් නොකර ම බලා හිඳිනා
නිලමණි නුඹ දිනිය යුතු ම යි
මුහුදු වෙරළක ලියල තිබුණා

## අමිතගේ හද ගැස්ම ........



# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



### ජීවිතය දිනවන බලාපොරොත්තු

දුවල, පුතාල දන්නව නේ ද ළඟ දි උසස් පෙළ විභාග ප්‍රතිඵල නිකුත් වුණා. ජයග්‍රහණය ලැබූ අයියලා අක්කලා ගැන හැමෝ ම කතා වුණා. සමහර ජයග්‍රහණයන් පිටුපස තියෙන්නෙ ගොඩාක් කටුක අත්දැකීම් ගොන්නක්. සමහර දේවල් අපට හිතාගන්නවත් බැරි තරම්.

ඔන්න මම දන්නා එක පුතෙකුගේ කතාවක් මේ. අපි එයාට මනුජ කියමුකෝ. රිය අනතුරක් නිසා මනුජගෙ තාත්තා නැති වෙන්නෙ එයා පුංචි කාලෙ ම යි. එදා ඉඳන් මනුජට යි, අම්මට යි ජීවිතය පහසු වුණේ නෑ. තාත්තගෙ මහ ගෙදරින් එයාලට එළියට බහින්න සිද්ධ වුණා. මනුජ ඉස්කෝලෙ ගියේ නගරයේ ජනප්‍රිය පාසකලට නිසා ඒ දෙන්නට අම්මගෙ ගමට යන්න පුළුවන්කමක් තිබුණෙත් නෑ.

ඉතින් අම්මා කළේ පාසල් යන්න එන්න පහසු තැනක් බලල පුංචි කඩ කාමරයක් කුලියට අරගෙන ඇඳුම් මහන්න පටන් ගත්ත එක. ඒ දෙන්න ජීවත් වුණෙත් කඩ කාමරයේ ම කොටසක් රෙදි ආවරණයකින් වෙන් කරගෙන. මුල දි කොට්ට උර, ඇඳ රෙදි වගේ දේවල්. එයා තමන්ගෙ ම උත්සාහයෙන් කාන්තා ඇඳුම් මහන්නත් ඉගෙනගත්තා.

"පුතේ උත්සාහය තියෙනවනම් කරන්න බැරි දෙයක් නෑ. මම මේ තනියෙන් ම ඇඳුම් මහන්නත් ඉගෙනගත්තෙ. මගෙ පුතාටත් පුළුවන් හොඳට ඉගෙන ගන්න. ඒකට ටියුෂන් පන්ති යන්න ම ඕනෙ නෑ."

ඇත්තට ම පන්ති යවන්න අම්මට සල්ලි තිබුණෙත් නෑ. යාංතමට කන්න බොන්න, කුලී ගෙවන්න, ඉස්කෝල යවන්න සෑහෙන මුදලක් විතර යි එයාලට හොයාගන්න පුළුවන් වුණේ. මනුජ පුංචි කාලෙ ඉඳල ම තනියෙන් පොත් පත්වල වැඩ කරගත්තා. එයාට විවේක වෙලාවල අම්මගෙ මැහුම් වැඩවලටත් උදව් වුණා. සාමාන්‍ය පෙළ පාස් වුණේ ඔය විදියට.

උසස් පෙළට ගණිත අංශයෙන් ඉගෙන ගන්න ආසාව තිබුණට එයාට බයක් දැනුණා කරගන්න පුළුවන් වෙයි ද කියලා. "මගෙ පුතාට පුළුවන්" අම්මා හැම වෙලේ ම කිව්වෙ එහෙම. අම්මාට මනුජගෙ හැකියාව ගැන ලොකු විශ්වාසයක් තිබුණා. ඒ වගේ ම මනුජට යහපත් අනාගතයක් ගොඩනැගීම තමයි අම්මගෙ එක ම බලාපොරොත්තුව වුණේ. බොහෝ දුරට කල්පනා කරල මනුජ වාණිජ විෂයන් කරන්න තීරණය කළා.

උසස් පෙළ අවුරුදු දෙක අම්මාගේ දුබල සිරුර මහන මැසිමට ම දිය වුණු කාලයක් වගෙයි මනුජට දැනුණෙ. අම්මා ගොඩක් මහන්සි වුණා. මනුජට පාසලේ ගුරුවරුන්ගෙන් වගේ ම යාළුවන්ගෙනුත් උදව් ලැබුණා. මනුජත් පුළුවන් විදියට යාළුවන්ටත් උදව් කරමින්, හැමෝ ම එකමුතුව වැඩ කරමින් විභාගෙට ලෑස්ති වුණා. ඔහුට තිබුණෙ එකම හීනය යි. ඒ අම්මාගේ කටුක ජීවිතේට සතුටක් එක් කරන එක. එයාගෙ බලාපොරොත්තුව ඉටු කිරීම. එහෙම නම් හොඳට ඉගෙනගන්න ඕන.

ඒ අධිෂ්ඨානයෙන් වැඩ කරපු මනුජට ඒ දෙකයි, බී එකයි. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට යන්න ලකුණු තියෙනවා. ඒ තමයි අම්මා මෙතෙක් ජීවිතේ ගොඩක් ම සතුටු වුණු දවස. අමාරු ම හරිය තියෙන්නෙ ඉස්සරහට බව මනුජ දන්නවා. මේ දවස්වල මනුජත් අම්මා එක්ක මැහුම් වැඩපළේ වැඩ. එයා පිරිමි ඇඳුම් මහන්න ඉගෙන ගනිමින් ඉන්නවා. තවදුරටත් ඉගෙන ගන්න ගමන් අම්මාගේ මැහුම් ව්‍යාපාරය දියුණු කරන එක තමයි මනුජගෙ බලාපොරොත්තුව.

"අම්මගෙ හයිය තමයි මගෙත් හයිය. මම අද මෙතන ඉන්නෙ මගෙ අම්මයි, අම්ම වගේ ම හොඳ මිනිස්සු පිරිසකුයි නිසා". මනුජ තමන්ගෙ උසස්පෙළ ජයග්‍රහණය ගැන කතා කළේ එහෙ ම.

තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 91

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | 2 | | ■ | 3 | | 4 | | 5 |
| | ■ | | ■ | ■ | | ■ | | ■ | |
| 6 | 7 | | ■ | 8 | | 9 | | ■ | |
| ■ | 10 | | 11 | ■ | | 12 | | | ■ |
| 13 | ■ | ■ | 14 | 15 | ■ | | ■ | ■ | 16 |
| 17 | | | ■ | 18 | 19 | ■ | 20 | | |
| | ■ | ■ | 21 | | | ■ | ■ | ■ | |
| ■ | 22 | 23 | ■ | 24 | | ■ | 25 | | |
| 26 | | | | ■ | ■ | 27 | | ■ | |
| ■ | 28 | | ■ | 29 | | | ■ | 30 | |

**පහළට**

1. ශරීරයේ වර්ධනය, පරිවෘත්තිය ක්‍රියා, ප්‍රජනනය හා මනෝ භාවයන් පාලනය කරන රසායනික ද්‍රව්‍යය.
2. ධාතුසේන රජුගේ පුතෙකි.
3. දාවිත් රජුගේ පුතෙකි.
4. යම් කිසි පුද්ගලයකු අගය කිරීම සඳහා දෙනු ලබන ත්‍යාගයකි.
5. දේව මාතාවන්ගේ පෞද්ගලික නාමය
7. කුඩා කෘමින් සතුන්ගේ වාසස්ථානයකි.
9. දිව්‍ය ලෝකවලින් එකකි.
11. කෑම පිසීමට භාවිතා වේ.
13. නීරෝගීව සිටීමෙන් වැඩි වේ.
15. ජුදා නොවන ජාතීන්
16. දේව මාතාවන්ට භාවිතා වන තවත් නමකි.
19. "මම නමස්කාර කරමි" යන්නට තනි පදයකි.
22. අධිකව වැඩ කිරීම නිසා අප පත් වන්නේ
23. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ මුදල් ඒකකය
25. වාදන භාණ්ඩයකි.
27. පොදු සේවා සහ සංවර්ධන කටයුතු සඳහා රජයක් විසින් පුද්ගලයන්ගෙන් හෝ ආයතනවලින් අය කරගනු ලබන මූල්‍ය දායකත්වය.

**හරහට**

1. ගල්ෆ් කලාපයේ පිහිටි වැදගත් තෙල් ප්‍රවාහන නාවික මාර්ගය වැටී ඇත්තේ මේ සමුද්‍ර සන්ධිය හරහා ය.
3. දේව මාළිගාව පිහිටා තිබුණේ
6. කුඹුරු හෑම සඳහා භාවිතා වේ.
8. ශු. පවුලේ සුරැකි පියා
10. "ලඳු" යන්නේ බහු වචනය.
12. චිත්‍රපටි කලාව
14. සූර්යයා
17. චීනයේ මුදල් ඒකකය
18. DNA අණුවල ඇති මූලික භෞතික හා ක්‍රියාකාරී ඒකක වේ.
20. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකි.
21. දේව මාතාවන් දර්ශනය වූ ස්ථානයකි.
22. ගිනි අව්වලින් පිට වේ.
24. "කනවා" යන්නෙහි උත්තම පුරුෂ ඒක වචන ක්‍රියා පදය
25. ජාකොබ් තුමාට දෙවියන් වහන්සේ කතා කොට ඔහුගේ නම වෙනස් කළ ස්ථානය
26. ඉරානයේ අග නගරය
27. වස්තුවක් මත ගුරුත්වාකර්ෂණය නිසා ක්‍රියා කරන බලය
28. ශරීරයේ පිටතින් ඇති සිවිය
29. දේව මාතාවන් බර්නදෙත් තුමියට දර්ශනය වූයේ
30. "රජින" යන්නට සමාන අරුත් දේ.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා,**
සාන්ත වින්සෙන්ති නිවාසය, මග්ගොන.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2026 ජූනි 15** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 91**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 89 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ර | ට | 2 ම | එ | ක | ට | | 3 හෙ | ර | |
| ං | | ං | | | | 4 ද | ළ | | 5 ගො |
| 6 ගි | හි | ජ | 7 න | 8 තා | ව | | 9 වෙ | ර | ළු |
| රි | | 10 රී | ප් | ප | | 11 ත | ද | | බෙ |
| 12 ද | ම් | | 13 ත | ය | 14 මී | න් | | 15 දැ | ල් |
| ඹු | | 16 කු | ලී | | 17 මු | තු | 18 බෙ | ල් | ලා |
| ල් | | | | 19 ස | රේ | | 20 න | ලා | |
| ල | | 21 ව | | | | 22 න | | | 23 දි |
| | 24 බ | ලා | පො | 25 රො | ත් | තු | 26 ව | | ට |
| 27 බ | ල | න | | න් | | 28 ව | ද | න | වා |

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 89 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 89 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - W. D. සඳලි ප්‍රනාන්දු, 11 ශ්‍රේණිය, සුගතානන්ද නවෝද්‍ය පාසල, මාදම්පේ.
- **දෙවන ස්ථානය** - ෂෙහාරා අංජලි පෙරේරා, 11 ශ්‍රේණිය, යහපත් එඬේරා කන්‍යාරාමය, පානදුර.
- **තෙවන ස්ථානය** - නයිජෙල් රුද්‍රිගු, 5 ශ්‍රේණිය, ශාන්ත තෝමස් ජාත්‍යන්තර විද්‍යාල, සීදුව.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2026 ජූලි / අගෝස්තු - "අධ්‍යාපනයේ ආධ්‍යාත්මික දිශානතිය"**
(ජූලි / අගෝස්තු කලාපය සඳහා ඔබ එවන ලිපි 2026 මැයි 15ට පෙර අප වෙත එවන්න.)
**2026 සැප්තැම්බර් / ඔක්තෝබර් - "පවුලේ මහිමාලංකාරය"**
(සැප්තැම්බර් / ඔක්තෝබර් කලාපය සඳහා ඔබ එවන ලිපි 2026 ජූලි 15ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2026

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. 1. ජේසුස් වහන්සේ කුරුසයේ උකුත් වන විට පැවසූ අවසන් වදන ලියන්න.
2. ජේසුස් වහන්සේ අපෝස්තුලුවරුන් වෙත පව් කමා කිරීමේ බලය දානය කළේ කවදාද?
3. තෝමස් තුමන් තම විශ්වාසය ප්‍රබල ලෙස ප්‍රකාශ කළ වගන්තිය ලියන්න.
4. ශුද්ධාත්ම වරම් ලැබූ අයෙකු සමාන වන්නේ කාට ද?
5. පෙන්තකොස්ත දිනය කාගේ උපන්දිනය ද?
6. ශුද්ධවූ පාවුලු තුමා උපත ලැබුවේ කොහේ දී ද?
7. ජේසුස් වහන්සේ ගෙනසෙරත් විල අසල දී කළ දේශනයෙන් පසු පේදුරු තුමාට පැවසුවේ කුමක් ද?
8. "ඔබ ක්‍රිස්තුවරයාණෝ ය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය" මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?
9. 7 වන බුවනෙකබාහු රජතුමාගේ ඉල්ලීම පරිදි 1543 දී ලංකාවට පැරණි පළමු ධර්මදූත කණ්ඩායම නම් කරන්න.
10. ක්‍රිස්ටෝපර් වාස් හා මරියා මිරැන්ඩා කාගේ දෙමව්පියන් ද?

02. 1. ශුද්ධවූ ජුසේවාස් මුනිතුමාව භාග්‍යවරයට හා ශුද්ධවරයට එසවූ ශුද්ධෝත්තම පියවරුන් දෙදෙනා නම් කරන්න.
2. ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා දේශීය කිතුනු සාහිත්‍යය ගොඩ නැගීමට කළ සේවාවන් 3ක් ලියන්න.
3. බ්‍රිතාන්‍ය යුගය තුළ මෙරට සේවය සඳහා පැමිණි ධර්මදූත නිකායන් 5ක් නම් කරන්න.

03. 1. උත්පත්ති පොතේ මැවීම පිළිබඳ කථා කොපමණ ද? ඒවා නම් කරන්න.
2. මිනිසාගේ උතුම්කම විද්‍යාමාන වන කරුණු තුන මොනවා ද?
3. ස්ත්‍රිය පුරුෂයාගේ ඉළ ඇටයකින් මවා ඇති නිසා ඔවුන් දෙදෙන සතු යුතුකම් හා අයිතිවාසිකම් 5ක් ලියන්න.

04. 1. දෙවියන් වහන්සේ ආදි මව්පියන්ට හා කායින්ට දඬුවම් කළේ කෙසේ ද?
2. අත්තික්කා කොළ අතු ඇඳ සිටි මිනිසාට හම් වස්ත්‍රයක් සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ කුමක්ද? කරුණු 3කින් පෙන්වන්න.
3. අප වැරදි කළ විට නිවැරදි මග යාමට අවවාද කර මාර්ග පෙන්වන පුද්ගලයන් 5කු නම් කරන්න.

05. 1. දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට කැඳවීම දුන් අවස්ථාවේ ඔහු දිරිමත් කළේ කෙසේ ද?
2. දෙවියන් වහන්සේ මෝසෙස් තුමා තමන් වහන්සේ කවුරුන් ද යන්න හඳුන්වා දුන්නේ කෙසේ ද?
3. ඉශ්රායෙල් ජනතාව නික්මයාම ගමන තුළ දී දිව්‍ය සංරක්ෂණය අත්දුටු ආකාරය කරුණු 5කින් විස්තර කරන්න.

## පිළිතුරු

01.
1. "පියාණෙනි, ඔබ වහන්සේගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි".
2. පාස්කු ඉරුදින සවස අපෝස්තුලුවරුන් වෙත වැඩම කිරීමේ දී
3. "මාගේ ස්වාමීනි මාගේ දෙවියනී" 4. හමුදා භටයෙකුට 5. ශුද්ධවූ සභාවේ
6. තාර්සස් හි ය. 7. "මුහුදට ගොස් දැල හෙළන්න" 8. පේදුරු තුමා ය.
9. ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරු 10. ශුද්ධවූ ජුසේවාස් මුනිතුමාගේ

02.
1. භාග්‍යවරය - ශුද්ධවූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා
   ශුද්ධවරය - ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
2. ග්‍රන්ථකරණය / නාට්‍ය කලාව / සංගීතය
3. සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය / ද ලාසාල් සොහොයුරන්ගේ පැවිදි නිකාය / මාරිස්ට් සොහොයුරන්ගේ පැවිදි නිකාය / ශු. පවුලේ කන්‍යා සොහොයුරියන්ගේ පැවිදි නිකාය / යහපත් එඬේරාණන්ගේ කන්‍යා සොහොයුරියන්ගේ පැවිදි නිකාය / ෆ්‍රැන්සිස්කාන කන්‍යා සොහොයුරියන්ගේ පැවිදි නිකාය

03.
1. දෙකයි. මැවීම පිළිබඳ පළමු කථාව / මැවීම පිළිබඳ දෙවන කථාව
2. බුද්ධිය / නිදහස් කැමැත්ත / අමරණීය ආත්මය
3. ස්ත්‍රීයට ද පුරුෂයාට ද ඔවුන් දෙදෙනාට දෙදෙනා නැතිව ජීවත් විය නොහැකි ය. / දෙදෙනාට දෙදෙනා නොමැති විට අසම්පූර්ණ ය. / ඔවුන් දෙදෙනාට සම මානව ගරුත්වයක් ඇත. / ගෞරවයෙන් හා ප්‍රේමයෙන් විවාහ ජීවිත ගත කළ යුතු ය. / එකිනෙකාගේ ගරුත්වය රැකෙන පරිදි ස්ත්‍රී පුරුෂ වෙනස්කම්වලට ගරු කරමින් දිවි ගෙවිය යුතු ය.

04.
1. වෛරයෙන් නොව ප්‍රේමයෙන් ය.
2. දෙවියන් වහන්සේගේ කරුණාව, ආදරය, රැකවරණය.
3. දෙමාපියන්, ගුරුවරුන්, වැඩිහිටියන්, ආගමික නායකයන්ගේ හෘද සාක්ෂිය

05.
1. "මම නුඹ සමඟ සිටිමි" කියා ය.
2. නො දැවෙන ගිනි පඳුරක් තුළින් දර්ශනය වීම.
3. රතු මුහුද තරණය / මස්සා, මෙරීබා හා මාරාහි දී බීමට ජලය ලැබීම / ආහාර සඳහා මන්නා ලැබීම / ආහාර සඳහා වටු කුරුල්ලන් ලැබීම / ගිනි ටැඹ හා වලාකුළු මඟින් මග පෙන්වීම.

**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

# ශුද්ධ ලියවිල්ල අර්ථකථනය කිරීම II

### ශුද්ධ බයිබලයේ පිටපත්

ශුද්ධ ලියවිල්ලේ පිටපත් සම්බන්ධව සාකච්ඡා කිරීමේ දී අපට හමුවන ලේඛන 3කි.

1. සෙප්ටුවාජින්ත පිටපත (ග්‍රීක)
2. මැසොරොටික් පිටපත (හෙබ්‍රෙව්)
3. වල්ගේට් පිටපත (ලතින්)

### සෙප්ටුවාජින්ත පිටපත

පලස්තීනයේ ජීවත් වූ ජුදාවරු විවිධ හේතූන් මත පලස්තීනයෙන් බැහැර වී වෙනත් රටවලවල ජීවත් විය. එලෙස සිදු වූයේ බොහෝ විට ආක්‍රමණ හේතුවෙන්, දේශපාලන ආරක්ෂාව පතා ය. එම පිරිස හැඳින්වූයේ ඩයස්පෝරාවේ ජුදාවරු ලෙස ය. පසු කාලයේ දී තම මුල් දෙමාපියන් මිය ගොස් පරම්පරා දෙකක් තුනක් පමණ යන විට හෙබ්‍රෙව් බස එම ජුදාවරුන්ගෙන් ගිලිහී ගොස් ඔවුහු ග්‍රීක බසට හුරු වූහ. ඔවුන්ට හෙබ්‍රෙව් බසින් ලියා ඇති ශුද්ධ ලියවිල්ල පරිහරණය කිරීමට නොහැකි වූයේ හෙබ්‍රෙව් බස නොදත් බැවිනි.

ක්‍රි.පූ. 3 වන සියවසේ පමණ දෙවන ටොලමි ෆිලදෙල්ෆස් රජු හෙබ්‍රෙව් හා ග්‍රීක් බස උගත් ප්‍රාඥයන් සැත්තෑ දෙනකු ගෙන්වා ඔවුන්ට පංච පුස්තකය පරිවර්තනය කිරීමට සලසා ඇත. (70 - "සෙප්ටුවා" ග්‍රීක බසින්) එම ප්‍රාඥයන් ගෙන්වා ගෙන ඇත්තේ ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිට ය. එම පරිවර්තනයේ දී හෙබ්‍රෙව් ලියවිල්ලේ ඇති පොත් 39ට අමතරව තවත් ලියවිලි 7ක් වැඩිපුර පරිවර්තනය වී ඇත. ඒ අනුව සෙප්ටුවාජින්ත පිටපතේ ශුද්ධ ලියවිලි පොත් 46 කි. එම ග්‍රන්ථ 7 ද්වීතිය සම්මත ග්‍රන්ථ ලෙස හැඳින් වේ.

1. තෝබිත්
2. ජුදිත්
3. සලමොන්ගේ ප්‍රඥාව
4. උපදේශකයා හෙවත් සිරාක්
5. බාරුක්
6. 1 මකබි
7. 2 මකබි

මෙම පොත්වලට අමතරව එස්තර් හා දානියෙල් පොත්වල ද ඇතැම් කොටස් සෙප්ටුවාජින්ත පරිවර්තනයට ලක් වී ඇත. ක්‍රි.ව. 90 දී මධ්‍යධරණී මුහුද අසල ජම්නියා නගරයේ දී ජුදා රබ්බිවරුන්ගේ සම්මේලනයක් පවත්වා ඇත. එම සම්මේලනයේ දී ද්වීතිය සම්මත ග්‍රන්ථ දේවානුභාවයෙන් ලියා ඇති බවට පිළිගැනීමට ලක් විය. එහි දී පෙන්වා දුන්නේ සෙප්ටුවාජින්ත පිටපත ශුද්ධ ලියවිල්ලෙහි හෙබ්‍රෙව් පිටපතට වඩා පැරණි බව ය. කෙසේ වෙතත් එම මත සම්බන්ධව ශුද්ධ ලියවිලි විශාරදයන් අතර මත භේද පවතී.

### මැසොරෙටික් පිටපත

ක්‍රි.ව. 6 වන සියවස පමණ වන විට ජුදා ප්‍රාඥයන් සඳහා මැසෝරි යන නාමය භාවිත විය. මැසොරිවරුන් ලෙස ඔවුන්ව හඳුන්වා ඇත්තේ ජුදා සම්ප්‍රදාය ව්‍යාප්ත කිරීමට ඔවුන් ගත් උනන්දුව හෙයිනි. හෙබ්‍රෙව් බයිබලය ලියවී තිබුණේ ව්‍යංජනාක්ෂරවලිනි. එය තේරුම් ගැනීමට බොහෝ දෙනාට නො හැකි විය. එම නිසා හෙබ්‍රෙව් ශුද්ධ බයිබලයට ප්‍රාණාක්ෂර යොදා සම්පාදනය කළේ මැසොරටික්වරුන් ය. මැසොරෙටික්වරුන් සම්පාදනය කළ හෙයින් එය මැසොරටික් පිටපත ලෙස හැඳින් වේ.

### වල්ගේට් පිටපත

ශුද්ධ වූ ජෙරොම් තුමා ලතින් සභා පියෙකි. එමෙන් ම එතුමා හෙබ්‍රෙව් බස පිළිබඳ ප්‍රාඥයෙකි. එතුමා අධ්‍යාපනය ලබා ඇත්තේ ජුදා රබ්බිවරුන් යටතේ ය. එම නිසා හෙබ්‍රෙව් බස මෙන් ම ශුද්ධ ලියවිල්ල පිළිබඳව ද මනා නිපුණතාවක් එතුමාට ඇත්තේ ය. ක්‍රි.ව. 382 දී පමණ ඩැමැස්කස් ශුද්ධෝත්තම පියතුමා

ජෙරොම් තුමාගෙන් ඉල්ලීමක් කළේ ය. එනම් ශුද්ධ ලියවිල්ල ලතින් බසට පරිවර්තනය කර දෙන ලෙස යි. එතුමා ඒ සඳහා වසර 24ක් ගත කළේ ය. ලතින් පිටපත පරිවර්තනය නිමා වූයේ ක්‍රි.ව. 406 දී ය. එම පිටපත අවශ්‍ය වූයේ ලතින් බස කථා කරන සුවහසක් ජනතාවට ය. එම නිසා එය ප්‍රයෝජනයට ගන්නා ලද්දේ "පොදු ජනතාව" ය. පොදු ජනතාව යන්නෙහි ලතින් බස අර්ථය 'වල්ගේට්' හෙවත් 'වූල්ගාතා' ය.

## දේව අනාවරණය

දෙවියන් වහන්සේ තමන් කවුරුන් ද යන වග මිනිසාට දැනුම් දිය යුතු ය. එම කටයුත්ත ශුද්ධ ලියවිල්ල තුළින් මානව සංහතියට එළිදරව් වේ. ශුද්ධ ලියවිල්ල මිනිසා අතට පත් කිරීමට දෙවියන් වහන්සේ තෝරා ගෙන ඇත්තේ මිනිස් නියෝජිතයන් ය. මිනිසාට තේරුම් ගත හැකි ආකාරයට මනුෂ්‍යයාගේ බසින් දෙවියන් වහන්සේව අනාවරණය කිරීමට සලස්වන්නේ දෙවියන් වහන්සේ ම යි. එම නිසා ශුද්ධ ලියවිල්ල මනුෂ්‍යයා විසින් ලියවුණ දේව වචනයකි.

ශුද්ධ බයිබලය හා දෙවියන් වහන්සේ අතර පවතින්නේ වෙන් කළ නො හැකි සබඳතාවකි. ලෝකය ආරම්භයේ සිට ඉතිහාසය පුරා ම අදෘශ්‍යමාන ව වැඩ වසන විශ්වයේ මැවුම්කරු උන් වහන්සේගේ මැවිල්ලක් වන මිනිසාට අනාවරණය වීම දේව අනාවරණයකි. ඒ සඳහා ග්‍රීක බසින් "ඇපොකලිප්ස්" හෙවත් අනාවරණය ලෙස ව්‍යවහාර වේ. මිනිසාට දෙවියන් වහන්සේ අනාවරණය වන ක්‍රම දෙකකි.

1. ස්වභාව ධර්මය තුළින්
2. ස්වභාව ධර්මයේ නීතිය ඉක්මවා යන විශේෂ ආකාරයකින්

ස්වභාව ධර්මය තුළින් අනාවරණය වනවා යයි පවසන්නේ ස්වභාව ධර්මයේ ක්‍රියාකාරීත්වය දෙස බැලීමේ දී එය ක්‍රියාත්මක වන ආකාරය කෙලෙස සිදු වන්නේ දැයි සොයා ගැනීම මත ය. උදාහරණ ලෙස,

1. ඊජිප්තුවේ සිට පොරොන්දු දේශය දක්වා ඉශ්රායෙල්වරුන් පැමිණි කාන්තාර ගමනේ දී
2. මන්නා සහ වටු කුරුල්ලන් ආහාර සඳහා ලැබීම.
3. මස්සා හා මෙරිබා ස්ථානවල දී පර්වතයෙන් ජලය ලැබීම.

ස්වභාව ධර්මය ඉක්මවා විශේෂ ආකාරයෙන් සිදුවන අනාවරණය යනු දෙවියන් වහන්සේ කවරෙක් දැයි තතු ඇති සැටියෙන් අනාවරණය කිරීම යි. ඒ සඳහා ආදි පියවරු, මෝසෙස්, වීර නායකයින්, රජවරුන් මාර්ගයෙන් දෙවියන් වහන්සේ අනාවරණය වේ.

දේව අනාවරණයේ අංග දෙකකි.

1. එම අනාවරණය උන් වහන්සේ තමන් පිළිබඳව තමන් විසින් ම අනාවරණය කර ගැනීම.
2. උන් වහන්සේගේ ගැලවීමේ සැලැස්ම මඟින් අනාවරණය කිරීම.

## දේවානුභාවය

දේවානුභාවය යනු කිසියම් කාර්යයක් කිරීමට දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයාව මෙහෙය වනු ලැබීම යි. එනම් දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ ස්ප්‍රීතුව තෝරා ගත් පුද්ගලයාට ප්‍රදානය කිරීම. එම දේවානුභාවය සඳහා යෙදෙන ග්‍රීක් වදන "තියෝනෙව්ටෝස්" ලෙස ව්‍යවහාර වේ.

**තියෝ - යන්නෙන් දෙවියන් වහන්සේත්**

**නෙව්මා - යන්නෙන් හුස්ම හෙළීමත්**

යන ග්‍රීක් වදන් එක් වී තියෝනෙව්ටෝස් ලෙස ව්‍යවහාර වී ඇත. එනම් දෙවියන් වහන්සේ හුස්ම හෙළන ලදී. දේව වචනය ග්‍රන්ථයක් ලෙස සම්පාදනය වීමේ දී දෙවියන් වහන්සේ තම ස්ප්‍රීතුව මිනිසාට දානය කර ඇත. එම නිසා ශුද්ධ බයිබලයේ ප්‍රධාන කර්තෘ දෙවියන් වහන්සේ වේ. උපකාරක කර්තෘ මිනිසා ලෙස හැඳින්විය හැක.

## දේවානුභාවයේ විවිධ අවස්ථා

දෙවියන් වහන්සේ මිනිසාට උන් වහන්සේගේ හුස්ම හෙවත් ස්ප්‍රීතුව දානය කරන්නේ විවිධ අවස්ථා කරණ කොට ගෙන ය. එනම්,

1. **එඬේරික දේවානුභාවය** - මිනිසාට දෙවියන් වහන්සේ මඟ පෙන්වයි. කුමක් සඳහා ද උන් වහන්සේ වෙනුවෙන් ක්‍රියාකාරී වීමට ය. නායකත්වය දැරීමට ය. එය දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය මිනිසා වෙත පතිත වීමකි.

   උදා - දාවිත් රජු, මෝසෙස් තුමා,
   ක්‍රිස්තුස් වහන්සේ, අපෝස්තුළුවරු

2. **වාචික දේවානුභාවය** - මිනිසාට දෙවියන් වහන්සේ සම්බන්ධව දේශනා කිරීමට හෙවත් දෙසීමට, කථා කිරීමට ලැබෙන ආත්මානුභාවය යි.

   උදා - දිවැසිවරු, ක්‍රිස්තුස් වහන්සේ

3. **ලිඛිත දේවානුභාවය** - තමන් දෙවියන් වහන්සේ සම්බන්ධව දේශනා කළ දෙය ලියා තැබීමට ලැබෙන ආත්මානුභාවය යි. ඒ සඳහා කැඳවන අයුරු 2 තිමති 3:16 පරිච්ඡේදයේ සටහන් වේ. මුළු ශුද්ධ ලියවිල්ල ම දේවානුභාවයෙන් ලියා ඇත. ශුද්ධ ලියවිල්ල ලේඛනගත කිරීමට බලපෑ අරමුණු 4කි.

   - ඉගැන්වීමට
   - දූර්මත දුරු කිරීමට
   - හික්මවීමට
   - ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමට උපදෙස් දීමට

දේවාත්මානුභාවය තුළින් ලියවූ ශුද්ධ බයිබලය පූජනීය ග්‍රන්ථයක් බවට පත් වී ඇත්තේ එම නිසා ය.

සටහන : **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**

**බලාපොරොත්තුවේ මාතාවෙනි අප ...**
**19 වන පිටුවෙන් ...**

එහෙයින් කිතුනු අප ඇයව මරිය තුමිය, දේව මෑණියන් සහ විවිධ ගෞරවාන්විත නාමයන්ගෙන් හඳුන්වන අතර මරිය තුමිය අද මුළු ලොව පුරා අදහනු ලබන වනිතාවන් අතර ආශීර්වාද ලත් තැනැත්තියකි. ඒ වගේ ම ශුද්ධ වූ සභාවේ මාතාව ද ඇය වේ. එතුමියගෙන් කිතුනු අප ලබන අත්දැකීම් බොහෝ ඇත. එතුමිය ද අප සමඟ ජීවමාන ව නිරන්තරයෙන් සිටින බව අපි දනිමු. ඒ සඳහා එතුමිය සිදු කළ ප්‍රාතිහාර්යයන් කදිම නිදසුන් ය. නිරයේ දුක් පීඩා විඳින ආත්ම උදෙසා, පව්කරුවන් උදෙසා දිනපතා එක් වී ශු. ජපමාලය උච්ඡාරණය කිරීමට දෙව් මව් අපට වරින් වර දර්ශනය වෙමින් ප්‍රකාශ කර තිබේ. මරිය තුමිය ජනතාව උදෙසා එදත් අදත් මැදිහත් වන්නේ ය. එදා කානා නුවර වතුර වයින් කිරීම (ජේසු තුමා සිදු කළ පළමු ප්‍රාතිහාර්යය) තුළ එතැන සිටි ජනතාව උදෙසා ජේසු තුමා ළඟ මැදිහත් වූ ආකාරය අපට ශු. ලියවිල්ල තුළ දක්නට ලැබේ. ඒ වගේ ම වර්තමානයෙත් දෙව් මව්ගේ මැදිහත් වීම විවිධාකාරයෙන් අත් දුටු අවස්ථාවලින් යුත් කිතුනුවන් අප අතර නැතුවා ම නොවේ. කිතුනු අප බොහෝ දෙනා අප උදෙසා මැදිහත් වන පිණිස නිතර නිතර දෙව් මව්න්ට ආයාචනා කරන්නෙමු. එම යැදුම් අසා දෙව් මව් අප උදෙසා ස්වර්ග යේ වැඩ සිටින දෙවි මහෝත්තමයාණන් ඉදිරියේ මැදිහත් වී අපගේ පැතුම් ඉෂ්ට කර දෙනු ලබයි. එහෙයින් දෙව් මව් අපගේ බලාපොරොත්තුව යි. මරිය තුමී හරි කරුණාවන්ත, බැහැපත්, සෑම දුක් කරදරයක් ම හදෙහි දරා ගෙන සිටින පව්කරුවන් වන අපව අයහපතින් මුදා ගන්න වෙර දරන ආදරණීය මාතාව යි.

අප බලාපොරොත්තුවෙන් සිටින්නේ අපගේ සිතුම් පැතුම් සාර්ථකව ඉටු කර ගැනීමට මරිය තුමියගේ පිහිටාශීර්වාදය යි. එහෙයින් දේව අම්මා කිතුනු අපගේ බලාපොරොත්තුවේ මාතාව යනුවෙන් ද හැඳින්විය හැකි ය. ඉතින් අප දිනපතා භක්තියෙන් යුතු ව දෙවි පියාටත්, දෙව් මව්න්ටත් ස්තුති කරමු; යාච්ඤා කරමු. ඔවුන් වහන්සේලා පිළිබඳ ස්ථිර විශ්වාසයෙන් සිටිමු.

# NATIONAL CATHOLIC WRITERS' ASSOCIATION

**Patron**

Rt. Rev. Dr. Jude Nishantha Silva,
Bishop of Badulla
National Chairman of Mass Communication & Media

Rev. Fr. Jude Chryshantha Fernando
National Director of Mass Communication & Media

**President**
Nawalage Godfrey Cooray
Senior Attorney-at-Law
0722270792

**Secretary**
Dr. Sachitha Milinda Mendis

**Assistant Secretary**
A.J.A. Abenayake

**Vice President**
Vergini Perera
Prasad Samarathunga
Lakshman Perera

**Editor**
Annette Marie Jacintha

**Sub Editor**
Priyantha Peterz

**Treasurer**
Asanka Srimal

**National Coordinator**
Sydney Karunasinghe

**National Print Media Coordinator**
Sureka Nilmini Illangakoon

**National Media Coordinator**
Joseph Stanislas Pius

**National Audio Visual Coordinator**
Piyal Sylvester

**Council Members**
Winifreeda Hapuwalana
Nirmal Viraj Anthony
Chaminda K. Samarakoon
Pascal Jayamanna
Patrik Fernando

2026.03.20

අධ්‍යක්ෂ පියතුමා, අධ්‍යක්ෂ කන්‍යාමට්තුමිය, විදුහල්පතිතුමා, විදුහල්පතිතුමිය,
සහ දයාබර දෙමාපියන් වෙත,

**<u>2026 වර්ෂයේ චිත්‍ර හා රචනා තරඟාවලිය</u>**

<u>චිත්‍ර තරඟාවලිය</u>

- ජාතික කතෝලික ලේඛක සංවිධානය විසින් 2026 වසර සඳහා පාසල් දරු දැරියන් සඳහා චිත්‍ර සහ රචනා තරඟ පෙළක් සංවිධානය කර තිබේ. ඒ අනුව වසර 5 සිට 10 දක්වා එක් කාණ්ඩයක් සහ වයස 11 සිට 12 දක්වා එක් කාණ්ඩයක් ලෙස චිත්‍ර තරග පැවැත්වෙයි. ඒ සඳහා 'ස්වභාවධර්මය සහ පරිසරය' යන මාතෘකාව යටතේ A4 ප්‍රමාණයට ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැකිය.

<u>රචනා තරඟාවලිය</u>

- වයස අවුරුදු 13 සිට 15 දක්වා සිසු සිසුවියන් සඳහා රචනා තරගයක් පැවැත්වෙන අතර එය 'ළමා අයිතිවාසිකම්', 'ලෝක සාමය', 'අධ්‍යාපන ක්‍රමය වෙනස් විය යුත්තේ ඇයි?' යන මාතෘකා අතරින් එකක් තෝරාගත හැකිය.

ඔබගේ නිර්මාණ පාසලේ විදුහල්පතිතුමා/තුමිය වෙතින් සහතික කරවා ගෙන, 'ජාතික කතෝලික ලේඛක සංවිධානය, ජෝනෙත් ශබ්දාගාරය, අංක 45, කිංසි පාර, කොළඹ 8 ලිපිනයට අප්‍රේල් මස 15 දිනට පෙර එවිය යුතුය. සියලුම තරගයන්හි ප්‍රථම ස්ථාන තුන සඳහා ත්‍යාග හිමිවන අතර 10 ස්ථානය දක්වා සහතික පත්‍ර ප්‍රධානය කෙරේ. එසේම ජයග්‍රාහී නිර්මාණ ජාතික කතෝලික ලේඛක සංවිධානය විසින් පළකරනු ලබන 'කිතුරැස' පුවත්පතෙහිද පළකෙරේ.

.................................
**සභාපති**
**(එන්. එල්. ගොඩ්ෆ්‍රි කුරේ)**
**ජ්‍යෙෂ්ඨ නීතිඥ**

.................................
**ලේකම්**
**(වෛද්‍ය එස්. එම්. මෙන්ඩිස්)**

National Catholic Writers' Organization, Joe-Neth Studio, 45, Kynsey Road, Colombo 08. - 0722270792

Luman's

රාගම, වත්තල, කඩවත, ජා-ඇල අවට

ජාති 7ක් සමඟ

බිරියානි ගෙදරටම

ඩිලිවරි කරගන්න



Call 077 272 0463



විදෙස්ගත වන ඔබේ

ආහාර ඇසුරුම් කිරීමට

Vaccum Packing

සඳහා අමතන්න

074 050 2605

Luman's Expo - Ragama



Sasindu Caters

& Reception Hall







සියලුම උත්සව අවස්ථා සඳහා වෙන් කරවා

ගැනීමට අමතන්න

Book Now 074 050 2605



මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින්
කොළඹ 10 එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.
පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/02/2025